# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,686 — 1966 මාර්තු 11 වැනි සිකුරාද — 1966.3.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 199 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | 210 |
| කනතුරු–ඇබෑර්තු .. .. .. .. | 205 | අය–වැය ලේඛන .. .. .. | 212 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 208 | දේපළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | 209 | මාර්ග කොමිටි දන්වීම .. .. .. | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම .. | 210 | විවිධ දන්වීම .. .. .. | 213 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී 29/62.

### මන්නාරම සුළු නගර සභාව

#### ගෝඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නිසි බලධරයා එනම්, මන්නාරම සුළු නගර සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.2.22 දින,
කොළඹ දී ය.

නියෝග

1. ගෝ ඝාතක ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද පොදු ගෝ ඝාතක ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ හෝ ඔහු විසින් සභාපතිගේ නියමයන්ට යටත්ව ඒ සඳහා බලය දෙන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකුගේ භාරයේ තිබිය යුතුය. එකී නිලධරයා විසින් එකී ගෝ ඝාතක ස්ථානය ඇතුළත වූ විනය සහ සනීපාරක්ෂක තත්ත්වය ගැන වගකිව යුතුය.

2 (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) ඒ සතා, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ඒ සඳහා සභාපති විසින් පත් කරන ලද නිලධරයකු විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේ නම්, මිස හා

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

---

**නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින අඟලකට රු. 10ක් සහ වැඩිවන සෑම අඟලක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් අය කරනු ලබන ගාස්තුව වෙනුවට, 1966 මාර්තු මස 1 වෙනි දින සිට, වෙළඳ ලකුණු දන්වීම් හැර, අන් සියළුම දන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින්ම අය කරනු ලබන බව සැමදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1966 පෙබරවාරි මස 11 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

(ආ) යම් දිනෙක පූ.භා. 7 ටත් 9 ටත් අතර කාලයේ දී මිස ගෝ ඝාතක ස්ථානයෙහි දී නොමැරිය යුතුය. එසේ වුවද විශේෂ අවස්ථාවලදී මෙහි සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

(2) කිසිවකු විසින් කිසිම සතකු—

(අ) (1) වැනි ඡේදය යටතේ එකී සතා අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 30 කාල සීමාවක් ඉකුත්වී යාමෙන් පසු යම් අවස්ථාවකදී, හෝ

(ආ) (1) ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන්, පණපිටින් ඉවත් කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි එකී ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස, ගෝ ඝාතක ස්ථානයෙහි දී නොමැරිය යුතුය.

3. ගෝ ඝාතක ස්ථානයට අයත් භූමි භාගයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ම ඒ සතා ඒ භූමි භාගයේ නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය සෑම විධි විධානයක් ම සැලැස්විය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට අයත් භූමි භාගයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියොත් 2 වැනි නියෝගයේ සඳහන් නිලධරයා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝ ඝාතක ස්ථානයේ දී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනු බහන් ආදිය 2 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයකුගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම්, ඔහු විසින් ඒ මස් හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වළකින අන්දමින් ඉවත් කරවිය යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයෙන් විධි විධාන සලස්වා ඇති පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට ගෝ ඝාතක ස්ථානය භාර නිලධරයා විසින් අවසර නොදිය යුතුය.

8. කිසිම තැනැත්තකු විසින්—

(1) මනුෂ්‍ය ආහාර සඳහා නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශිත යම්කිසි මසක් හෝ අතුනු බහන් ආදියත් 2 වැනි නියෝගයෙහි සඳහන් නිලධාරයකුගේ නියමය යටතේ හැර ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාර වූ නිලධාරයා විසින් '' මන්නාරම සුළු නගර සභාව '' යන සලකුණ හා අවස්ථාවෝචිත පරිදි '' හරක් මස් '' හෝ '' එළුමස් '' යන වචන මුද්‍රා යොද තිබේ නම් මිස ඒ කුණපය ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙනත් යම් සතකු ඉදිරියේ හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත් කරන හෝ මුවා කරනතුරු හා ස්ථානය සුද්ධ පවිත්‍ර කරන තුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. (1) මෙහි මීට පසුව සඳහන් විධි විධානවලට යටත්ව, ගෝ ඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා හෝ සතකු මැරීම සඳහා පහත සඳහන් වන ප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවිය යුතුය :—

හරකුන් සඳහා එකකුට ... ... ... රු. 1 0
එළුවන් හෝ බැටළුවන් සඳහා එකකුට ... ... රු. 0 50

එසේ වුවද ගෝ ඝාතක ස්ථානයට ගෙනෙන ලද සතකු මැරීම සඳහා නුසුදුසු යයි ප්‍රතික්ෂේප කළ කල්හි හෝ මරනු ලැබීමෙන් ඉවත් කරනු ලැබූ කල්හි ඒ සතා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තුව ශත 50 විය යුතු ය.

(2) යම්කිසි සතකු සම්බන්ධයෙන් (1) වැනි ඡේදය යටතේ නියමිත ගාස්තුව සභාවට ගෙවනු ලැබ, එකී ගාස්තුව එසේ ගෙවනු ලැබූ බවට සාක්ෂියක් වශයෙන් වූ නිල කුවිතාන්සියක් ගෝ ඝාතක ස්ථානය භාරකරු වෙත හෝ එකී කුවිතාන්සිය භාර දිය යුත්තේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා වශයෙන් සභාපති විසින් පත් කරනු ලැබිය හැකි වෙන යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලබන තුරු ගෝ ඝාතක ස්ථානයේ දී කිසිම සතකු මැරීම හෝ ඉන් ඉවත් කරගෙන යෑම හෝ නො කළ යුතුය.

11. ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් ගෝ ඝාතක ස්ථානයේ මරනු ලබන—

(අ) සියලුම හරකුන්ගේ ලේඛනයක් ද,

(ආ) සියලුම එළුවන්ගේ හා බැටළුවන්ගේ ලේඛණයක්ද තබා ගත යුතුය. ඒ ලේඛනය පහත දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලව විය යුතුය.

| | | |
|---|---|---|
| | හරක් වවුවරයේ අංකය : | |
| | විස්තරය : | |
| | පාට : | |
| | වයස : | |
| | දකුණු පාර්ශ්වය / වම පාර්ශ්වය | හං නිවරණ |
| | ගෝ ඝාතකගේ නම : | |
| | හරක් කොටුවට දැමූ දිනය සහ වේලාව : | |
| | පරීක්ෂා කළ දිනය : | |
| | ඝාතනය කළ දිනය : | |
| | හරකුන් භාරගන්නා නිලධාරියාගේ කෙටි අත්සන: | |
| | වෙනත් කරුණු : | |

12. මේ නියෝගවල—

'' සභාපති '' යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

'' සභාව '' යනුවෙන් මන්නාරම් සුළු නගර සභාව අදහස් වේ.

''සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා'' යනුවෙන් මන්නාරමේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

''ආඥපනත'' යනුවෙන් (272 වෙනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥපනත අදහස් වේ.

3–482—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී.—බී. 69/41
ප.පා.දෙ.—ජීජී 1/1/32/1

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අයකිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹදීය.

3–503—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 37 වන වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ගම් ප්‍රදේශයේ ගම්සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දීය.

3–496—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී—බී 69/41
ප.පා.දෙ—ජී.ඊ. 1/2/16

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, කළුතර දිස්ත්‍රික්කයේ හොරවල ගම් ප්‍රදේශයේ ගම් සභාවට ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක් ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

එම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දීය.

3–505—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 69/41
ප.පා.දෙ.—ජීඊ 1/1/40

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ගම් ප්‍රදේශයේ ගම් සභාවට, ඒ ගම් ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

3–502—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇල්—ඩී—බී 39/52
ප.පා.දෙ—ජී.බී. 8/3/7

## ගම්සභා ආඥාපනත

### ආඥාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම එකී 47 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ගම් ප්‍රදේශයේ ගම් සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

3–487—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 9/64 (54)

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකරය වන) ගම්සභා ආඥාපනතේ 5 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965.2.6 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළෙයි පත්තු දේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මධ්‍යම කෝරළෙයි ගම් ප්‍රදේශය නැවත බෙදා වෙන් කිරීමට අදාළව 1964 අගෝස්තු 7 වැනි දින අංක 14,135 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවේ සඳහන් බෙදීම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයේ දක්වෙන ආකාරයට මෙයින් විධිවිධාන සලසනු ලැබේ.

### උපලේඛනය

1. එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව, ඒ ගම් ප්‍රදේශයට අදාළ විය හැකි පරිදි ගම්සභා ආඥාපනතේ සියලුම කාර්යයන් සඳහා පරණ ගම් ප්‍රදේශ්යේ ගම් සභාවේ අනුප්‍රාප්තික සභාව විය යුතුය.

2. පරණ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදන කරන ලදුව, 1965 ජනවාරි 31 වැනි දින වලංගුව පැවති, සියලුම අතුරු ව්‍යවස්ථා, මේ අතුරු ව්‍යවස්ථා ඒ අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට එක් එක් අලුත් ගම් ප්‍රදේශයට වලංගුව පැවතිය යුතුවත් හැර, ඒවා ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදනය කරනු ලැබූ ලෙස සැළකිය යුතුය.

3. 1965 ජනවාරි 31 වැනි දින පරණ ගම් ප්‍රදේශය ගම් සභාවේ පොදු අරමුදලේ බැරට තිබුණු මුදල, 1965ගේ පෙබරවාරි 1 වැනි දින සිට, පිළිවෙලින්, 9 : 16 යන අනුපාතය අනුව, වාලච්චෙනායි සහ ඔඩ්ඩමාවඩි ගම් ප්‍රදේශවල එක් එක් ගම් සභාවේ පොදු අරමුදලට බැර කළ යුතුය.

4. 1965 ජනවාරි 31 වැනි දින පරණ ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබුණු හෝ එහි පාලනය යටතේ පැවැති පහත සඳහන් චංචල දේපළ, 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඔඩ්ඩමාවඩි අළුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පවරනු ලැබූ ලෙස සැළකිය යුතු අතර, පරණ ගම් ප්‍රදේශයේ ගම්සභාවේ ඉතිරි නිශ්චල දේපළ වාලච්චේනායි අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත පවරනු ලැබූ ලෙස සැළකිය යුතුය :—

| | |
|---|---|
| ලියන මේස | 2 යි. |
| අල්මාරි | 1 යි. |
| ටෙන්ඩර් පෙට්ටි | 1 යි. |
| පොත් රාක්ක | 1 යි. |
| බන්දේසි | 3 යි. |
| අලුත් අත්පුටු | 2 යි |
| පරණ පුටු | 5 යි. |
| රාක්ක | 4 යි. |

ඔඩ්ඩමාවඩි හි මාතෘදරකාභිවෘධි මධ්‍යස්ථානයේ ඇති ලී බඩු සහ උපකරණ.

පිළිවෙලින් ඔඩ්ඩමාවඩි හා මිරවඩි හි ප්‍රජාමණ්ඩලවල ඇති ලී බඩු, පොත් පත් සහ ලියකියවිලි.

5. 1965 ජනවාරි 31 වැනි දින පරණ ගම්ප්‍රදේශයේ ගම් සභාව වෙත පැවරී තිබුණු හෝ එහි පාලනය යටතේ පැවැති එක් එක් ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ 1965 පෙබරවාරි 1 වැනි දින සිට, ඒ ඉඩම, ගොඩනැගිල්ල හෝ අනිකුත් නිශ්චල දේපළ පිහිටි අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභාව වෙත පවරනු ලැබූ ලෙස සැළකිය යුතු ය.

6. පරණ ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සියලුම අයිතිවාසිකම්, ණය තුරුස්, සහ වගකීම්, ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට මාරු කළ හැටියට සැළකිය යුතුය.

7. පරණ ගම් ප්‍රදේශයේ ගම් සභා කාර්යාලයේ නඩත්තු කරගෙන යන ලද සියලුම ලිපිගොනු, කඩදාසි සහ ලියකියවිලි ඒවා එක් එක් අලුත් ගම් ප්‍රදේශයේ ගම් සභාවට අදාළ වන ප්‍රමාණයට 1965 පෙබරවාරි 1 වැනි දින සිට ඒ අලුත් ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයට මාරු කරන ලද හැටියට සැළකිය යුතු ය.

8. පරණ ගම්සභාවේ දැනට සිටින නාවූත්, කලින් සිටියාවූත් සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වූ දායක මුදල් සම්බන්ධයෙන් පරණ ගම් ප්‍රදේශයේ ගම් සභාවේ වගකීම් පහත සඳහන් ආකාරයට බෙදිය යුතු ය :—

(අ) පරණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන්, ඒවා පිළිවෙළින් වාලච්චේනායි සහ ඔඩ්ඩිමාවඩි ගම්ප්‍රදේශවල එක් එක් ගම්සභාව අතර, 9 : 16 යන අනුපාතය අනුව.

(ආ) පරණ ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සේවය කරනු ලැබ, මාරු කරන ලද සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන්, වාලච්චේනායි සහ ඔඩ්ඩමාවඩි ගම් ප්‍රදේශවල එක් එක් ගම් සභාව අතර, 9 : 16 යන අනුපාතය අනුව.

(ඇ) දැනට පරණ ගම් ප්‍රදේශයේ ගම් සභාවේ සේවය කරනු ලබන අයට විශ්‍රාම වැටුප ගෙවීම සම්බන්ධයෙන් පිළිවෙළින් වාලච්චේනායි සහ ඔඩ්ඩිමාවඩි ගම් ප්‍රදේශවල එක් එක් ගම් සභාව අතර 9 : 16 යන අනුපාතය අනුව.

9. මේ අතුරු ව්‍යවස්ථාවල :—

" අලුත් ගම් ප්‍රදේශය " යනුවෙන්, වෙනත් අන්දමකට සඳහන් කර නොත් මිස, 1964 අගෝස්තු 7 වැනි දින අංක 14,135 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවට යාකොට ඇති උපලේඛනයේ විස්තර කරන ලද වාලච්චේනායි ගම් ප්‍රදේශය හෝ ඔඩ්ඩිමාවඩි ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ ; තවද,

" පරණ ගම්සභා ප්‍රදේශය " යනුවෙන් මඩකලපු දිස්ත්‍රික්කයේ මධ්‍යම කෝරළෙයි ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

3–497—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

ඇල්. ඕ.—බී. 22/53

## පන්නල ගම්සභාව

### විදුලිබල පනත

ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිවරයාගෙන් විමසා, පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් (205 වැනි අධිකාරය වන) විදුලි බල පනතේ 46 වැනි වගන්තිය යටතේ පනවනු ලැබූ නියෝග.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.2.23 වැනි දින,
කොළඹ දීය.

### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වන වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම් සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම් සභාව අදහස් කරනු ලැබේ.

"අධිකාරි" යනුවෙන් පන්නල ගම්සභාවේ විදුලි දෙපාර්තමේන්තුවෙහි විදුලි අධිකාරි අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනෙකු විසින්—

(අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දිනට යටත් පිරිසෙයින් දවස් දහහතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි පිළියෙළ කළ ඉල්ලුම් පත්‍රයක් බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතුය, තවද

(ආ) විද්‍යුත් වේගවාහක කම්බිය සඳහා ගාස්තු බලපත්‍රලාභියා වෙත කලින් ගෙවිය යුතුය. නැතහොත්, බලපත්‍රලාභියාට අවශ්‍ය වන්නේ නම්, පනතේ 33 වන වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමග ලියවිල්ලකින් වූ ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

3. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින් ම බල පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණයන්ට අනුව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතුය.

4. (1) පාරිභෝගිකයාට අයත් භූමි භාගයෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි පරිවර්තක, ප්‍රධාන පුළුසු, විද්‍යුත් මාපකය සහ විදුලි යතුරු පුවරුව බලපත්‍රලාභියා සතු දේපල විය යුතු අතර, බලපත්‍රලාභියාගේ බලය පවරනු ලැබූ සේවකයෙකු හැර, වෙන යම් කෙනෙකු විසින් මොනම කාරණයක් නිසාවත් ඒවා වෙනස් කිරීම හෝ අතපත ගෑම නොකළ යුතුය.

(2) බලපත්‍රලාභියාගේ ප්‍රධාන පුළුසුවේ හෝ මාපකයේ සිට ස්වකීය පාර්ශවයේ ඇත්තා වූ කම්බි, කේබල් කම්බි හෝ වෙන යම් උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වගකිව යුතුය.

(3) පනතේ 47 (3) වන වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේ දී එය සෝදිසි කර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රයෙහි සලසා ඇති පරිදි පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(4) යම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බි හෝ උපකරණවල යම් කොටසකින් විදුලි බලය කාන්දු වුවහොත් ස්වකීය ස්ථානයේ මාපකයේ පාවිච්චි වූ ලෙස සඳහන් සියලුම විදුලි බලය සඳහා ගාස්තු ගෙවීමට ඒ පාරිභෝගිකයා බැඳී සිටිය යුතුය.

5. (1) තමාගේ ස්ථානයට විදුලි බලය සැපයීමෙන් පසු යම් විටෙක තාවකාලිකව හෝ ස්ථිරව එවකට පාවිච්චි වන එකට වඩා විශාල යම් ලාම්පුවක්, පංකාවක් හෝ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ යම් අමතර ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙන යම් උපකරණයක් සවි කිරීමට හෝ, ඒ ස්ථානයෙහි ඇද තිබෙන විදුලි කම්බි මොනම ආකාරයකින් වෙනස් කිරීමට හෝ දික් කිරීමට අදහස් කරන සෑම පාරිභෝගිකයකු විසින් ම එබඳු දික් කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් කලින් ඒ බව බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. ඒ කාර්‍යය විදුලිය කොන්ත්‍රාත්කරුවකු ලවා කරවා ගැනීම පාරිභෝගිකයාගේ අදහස නම් ඒ සමගම කොන්ත්‍රාත්කරුගේ නම සහ ලිපිනය ද දැනුම් දිය යුතුයි.

(2) ප්‍රධාන විදුලිබල සංස්ථාපනයට තාවකාලිකව හෝ ස්ථිරව, එවකට පාවිච්චි වන එකට වඩා විශාල යම් දික් කිරීමක්, ලාම්පුවක්, පංකාවක් හෝ මෝටරයක් සම්බන්ධ කිරීම හෝ සම්බන්ධ කරවීම නැතහොත් අමතර ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙන යම් උපකරණයක් සවි කිරීම, ඒ දික් කිරීම, ලාම්පුව, පංකාව, මෝටරය, අතිරේක ලාම්පුව හෝ වෙනත් උපකරණය අධිකාරි විසින් හෝ ඒ වෙනුවෙන් බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් පරීක්ෂා කර සහ අත්හදා බලා සතුටුදායක යයි ඒත්තු ගතහොත් මිස, කිසිම පාරිභෝගිකයකු විසින් නොකළ යුතුය.

6. (1) යම්කිසි ස්ථානයක බලපත්‍රලාභියාගේ ප්‍රධාන පුළුසුව උණුවී ගිය හොත්, පාරිභෝගිකයා විසින් අවස්ථාවෝචිත පරිදි බලපත්‍රලාභියාගේ අධිකාරි වෙත හෝ විදුලිබල ස්ථානය හෝ උප බලස්ථානය භාර නිලධරයා වෙත ඒ බව වහාම දැනුම් දිය යුතුය.

(2) බලපත්‍රලාභියාගේ බලය පවරනු ලැබූ නිලධරයකු හෝ කම්කරුවකු නොවන කිසිවකු විසින් බලපත්‍රලාභියාගේ දේපල වන උණුවී ගිය පුළුසුව වෙනුවට වෙනත් සේව තූලක් සවි නොකළ යුතුය.

(3) පාරිභෝගිකයාගෙන් බලපත්‍රලාභියා සතු දේපල වන පුළුසුව අලුතින් සවි කිරීමට බලපත්‍රලාභියාගේ යම් නිලධරයකුගේ හෝ කම්කරුවකුගේ සේවය වුවමනා කරන්නේ නම් බලපත්‍රයේ සඳහන් පරිදි ඒ සඳහා ගෙවිය යුතු නියමිත ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

(4) පාරිභෝගිකයාගේ විදුලි කම්බිවල හෝ උපකරණවල වරදින් බලපත්‍රලාභියා සතු යම් පුළුසුවක් උණුවී ගියහොත් බලපත්‍රයේ සඳහන් පරිදි ඒ සඳහා නියමිත ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

7. විදුලි බලය සැපයීමේදී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සිදුවන බාධා හේතු කොට ගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා පාරිභෝගිකයාට වගකීමට බැඳී නොසිටියි.

8. පනතේ 45 වන වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුණා වූ විදුලිබල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කරන අවස්ථාවේදී අත්හදා බැලීම සහ නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් පරිදි නියමිත ගාස්තුව අය කළ යුතුවාත් හැර එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

9. (1) සියලුම ගාස්තු ගණන ඉදිරිපත් කරන දිනයට අයවිය යුතුව තිබෙන්නා සේ සලකනු ලැබිය යුතුය.

(2) ගණන් ඉදිරිපත් කිරීමෙන් පසු සතියක් ඇතුළතදී ඒ පැමිණිල්ල කරන ලද්දේ නම් මිස, ගණනක හරි වැරදි තාවයට විරුද්ධ යම් පැමිණිල්ලක් බලපත්‍රලාභියා විසින් භාර නොගත යුතුය.

10. (1) ස්වකීය පදිංචි ස්ථානය හැර යාමට අදහස් කරන සෑම පාරිභෝගිකයකු විසින් ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(2) (1) වන ඡේදයේ සඳහන් පරිදි එසේ දැනුම් දීමක් කර නොමැති අවස්ථාවක, පාරිභෝගිකයාට විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රලාභියා වෙත දැන්වීම ලැබුණ දින සිට දවස් තුනක් ගතවනතුරු තමා පදිංචි ස්ථානයේ වූ බලපත්‍රලාභියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වග කිව යුතු අතර, ඒ ස්ථානයේ පාවිච්චි කරන්නට යෙදුන සියලු විදුලි බලය සම්බන්ධයෙන් පාරිභෝගිකයා ගාස්තු ගෙවිය යුතුය.

එසේ වුවද එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රලාභියා විසින් සේවය අසම්බන්ධ කරනු ලැබූ අවස්ථාවක එසේ අසම්බන්ධ කළ වේලාව දක්වා පමණක් ඒ ස්ථානයේ පාවිච්චි කරන ලද විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා බැඳී සිටිය යුතුය.

11. කිසිම පාරිභෝගිකයකු විසින්—

(1) රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරු විසින් විදුලි කටයුතු කර ගෙන යාමට අවශ්‍ය ප්‍රාගුණ්‍යය ඇතැයි සහතික කරන ලද්දාවූ හෝ පිළිගත් විදුලි කර්මාන්ත ශාලාවක හෝ වෙළඳ සමාගමක හෝ විදුලි බල ස්ථානයක යටත් පිරිසෙයින් අවුරුදු තුනකවත් ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇත්තාවූ ,හා

(2) අවුරුදු දෙකකට නො අඩු කාල පරිච්ඡේදයක් තුළ නොකඩවා විදුලිය කටයුතු පිළිබඳ ඉංජිනේරු කර්මාන්තයෙහි ව්‍යවෘතව සිටියා වූ කෙනෙකු නොවන යම් තැනැත්තකු—

(අ) බලපත්‍රලාභියාගේ විදුලි සම්පාදක සංදමයට සම්බන්ධ කිරීමේ අදහසින් පාරිභෝගිකයාගේ යම් ස්ථානයක යම් අලුත් විදුලි බල සංස්ථාපනයක කම්බි ඇදීම හෝ සවි කරන උපකරණ හෝ සවි කරන ලද උපකරණවලට අදාළ යම් වැඩක් කර ගෙන යාම සඳහා, හෝ

(ආ) පාරිභෝගිකයාගේ යම් ස්ථානයක විදුලිය බල සංස්ථාපනයක් බලපත්‍රලාභියාගේ විදුලි සම්පාදක සංදමයට සම්බන්ධ කළාට පසු ඒ විදුලි බල සංස්ථාපනය සම්බන්ධයෙන්—

(i) විදුලි බල සංස්ථාපනය වෙනස් කිරීම, සකස් කිරීම, ඊට එක් කිරීම හෝ එය අලුත්වැඩියා කිරීම යුක්ත වූ හෝ ඒ ස්වභාවයෙන් යුක්ත වූ හෝ

(ii) ඒ විදුලිබල සංස්ථාපනයේ ප්‍රමාණය සහ ස්වභාවය කිසිම විදියකින් වෙනස් නොකරන්නා වූ හෝ ඊට හානිකර නොවන ලෙස ලාම්පු, පංකා, ස්විච් යතුරු හෝ වෙනත් අංගෝපාංග කොටස් වෙනුවට සාමාන්‍යයෙන් අලුත් ඒවා දැමීම නොවන යම් විදුලි කර්මාන්තයක් කිරීම සඳහා නොයෙදවිය යුතුය.

12. (1) යෝජිත කර්මාන්තය අධිකාරි විසින් හෝ ඒ වෙනුවෙන් බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් පරීක්ෂා කර බැලීමට හැකි වන අයුරු ඒ පිළිබඳව දවස් දෙකකට නො අඩු දින ගණනකට කලින් බලපත්‍රලාභියා වෙත දැනුම් දීමෙන් පසුව මිස එවකට පවත්නා විදුලි බල සංස්ථාපනයක එක් කිරීම්, වෙනස් කිරීම් සහ සකස් කිරීම් ඇතුළුව සංස්ථාපන කර්මාන්ත බඳු කිසිම විදුලිය කර්මාන්තයක් ආරම්භ නොකළ යුතුය.

(2) ඒ නිලධරයා යෝජිත කර්මාන්තය අනුමත කරයි නම් ඔහු විසින් මාපකය සවි කළ යුතු ස්ථානය කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡා කොට නියම කළ යුතු අතර, පනතේ 60 වන වගන්තිය යටතේ ඒ සඳහා සම්පාදනය කරනු ලැබිය හැකි යම් නියෝගවලට අනුකූලව කොන්ත්‍රාත්කරු විසින් කර්මාන්තය කරගෙන යා යුතුය.

13. (1) 12 වන නියෝගයෙහි සඳහන් යම් විදුලිය කර්මාන්තයක් සම්පූර්ණ කරනු ලැබූ විට අධිකාරි විසින් හෝ බලපත්‍රලාභියා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂා කොට අත්හදා බැලිය යුතු අතර—

(අ) විදුලිබල සංස්ථාපනය නියමිත නියෝගවලට එකඟව පවත්නේ නම් ඒ ස්ථානයට විදුලි බලය සැපයීම කළ යුතුය, තවද

(ආ) විදුලිබල සංස්ථාපනය නියමිත නියෝගවලට එකඟව නොපවත්නේ නම් විදුලිබල සංස්ථාපනය ඒ නියෝගවලට එකඟ වන පරිද්දෙන් සකස් කරන තුරු විදුලි බලය සැපයීම නොකළ යුතුය.

(2) මේ නියෝගය යටතේ යම් විදුලිය බල සංස්ථාපනයක් පරීක්ෂා කර බැලීම හා අත්හදා බැලීම සඳහා ගෙවිය යුතු ගාස්තුව පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

14. බලපත්‍රලාභියා වෙත දැන්වීමක් නොදී හා බලපත්‍රලාභියාගේ පූර්ව අනුමැතිය ලබා නො ගෙන යම් ස්ථානයක යම් අලුත් විදුලි බල සංස්ථාපනයක් සම්බන්ධයෙන් වූ යම් විදුලි කර්මාන්තයක් කරගෙන යනු ලබන්නේ නම් ඒ විදුලි කර්මාන්තය කරගෙන යනු ලැබූ ස්ථානයට විදුලි බලය සැපයීම බලපත්‍රලාභියා විසින් ප්‍රතික්ෂෙප කළ හැකිය. නැතහොත් අධිකාරි විසින් හෝ බලපත්‍රලාභියා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ නිලධරයා විසින් අවශ්‍ය යයි සැලකිය හැකි පරිදි විදුලි කම්බි ඇද තිබෙන ක්‍රමය වෙනස් කිරීම හෝ අමුතු කිරීම කළ යුතු යයි පාරිභෝගිකයාට නියම කළ හැකිය. ඒ වෙනස් කිරීම් හා අමුතු කිරීම් විධිමත් පරිදි කළහොත්, අධිකාරි විසින් හෝ ඒ නිලධරයා විසින් සංස්ථාපනය නැවත පරීක්ෂා කොට අත්හදා බැලිය යුතුය. එමෙන් ම එය නිසියාකාර කර තිබෙන බව ඒත්තු ගියහොත් එම ස්ථානයට විදුලි බලය සැපයීම කළ යුතුය.

15. බලපත්‍රලාභියා වෙත පූර්ව දැන්වීමක් නොකර හා ඔහුගෙන් අවසරය ලබා නොගෙන බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක සංදමයට එවකටත් සම්බන්ධ කොට ඇත්තාවූ සංස්ථාපනයකට යම් දීර්ඝ කිරීමක් කරනු ලැබූ විට සම්පූර්ණ සංස්ථාපනයම බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක සංදමයන්ගෙන් අසම්බන්ධ කිරීමට යටත් විය යුතුය.

16. සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලැබිය හැකි යම් ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතු අතර, විදුලි බලය අවශ්‍ය වන අවස්ථාවට පැය හතලිස් අටකට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රලාභියාගේ කාර්යාලය වෙත භාර දිය යුතුය.

3–500—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී 22/53.

## විදුලි බල පනත

ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිවරයාගෙන් විමසා පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුණෛයි ගිනිකොණ සහ එරුවිල් ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් (205 වෙනි අධිකාරය වන) විදුලි-බල පනතේ 46 වෙනි වගන්තිය යටතේ පනවනු ලැබූ නියෝග.

ඒ. ඒ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් (205 වෙනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් වේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වෙනි වගන්තිය යටතේ මන්මුණෛයි ගිනිකොණ සහ එරුවිල් ගම් ප්‍රදේශයේ ගම් සභාව වෙත නිකුත් කරන ලද බල පත්‍රය අදහස් වේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුණෛයි ගිනිකොණ සහ එරුවිල් ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනකු විසින්—

(අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දිනට යටත් පිරිසෙයින් දවස් දහහතරකට මත්තෙන්, ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘතියෙහි පිළියෙළ කළ ඉල්ලුම් පත්‍රයක් බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතුය, තවද

(ආ) විද්‍යුත් වේගවාහක කම්බිය සඳහා වූ ගාස්තු බලපත්‍රලාභියා වෙත කලින් ගෙවිය යුතු ය. නැතහොත් බලපත්‍රලාභියාට අවශ්‍ය වේ නම් පනතේ 33 වැනි වගන්තිය යටතේ ඔහු සමග ලියවිල්ලකින් වූ ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

3. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින් ම බලපත්‍රයේ සඳහන් මිල ප්‍රමාණයන් අනුව එකී විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතු ය.

4. (1) පාරිභෝගිකයාට අයත් භූමි භාගයෙහි පිහිටි විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි පරිවර්තක ප්‍රධාන සේව නූල්, විදුලිය මාපකය සහ විදුලි යතුරු පුවරුව බලපත්‍රලාභියාගේ දේපළ විය යුතු අතර, බලපත්‍රලාභියාගෙන් අවසර ලත් ඔහුගේ සේවකයෙකු හැර වෙන කිසිම කෙනකු විසින් මොනම කාරණයක් නිසාවත් ඒවා ඉවත් කිරීම හෝ අතපත ගෑම නො කළ යුතු ය.

(2) බලපත්‍රලාභියාගේ ප්‍රධාන සේව නූලේ හෝ මාපකයේ සිට ස්වකීය පාර්ශ්වයේ ඇත්තා වූ කම්බි, කේබල් කම්බි හා වෙනත් උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වගකිව යුතු ය.

(3) පනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලිබල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේ දී එය සෝදිසි කර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රයෙහි සලසා ඇති පරිදි පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතු ය.

(4) යම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ උපකරණවල යම් කොටසකින් විදුලි බලය කාන්දුවීමක් සිදුවන විට, ස්වකීය ස්ථානයේ විදුලිය මාපකයේ පාවිච්චි වූ ලෙස සඳහන් වන සියලුම විදුලි බලය සඳහා ගාස්තු ගෙවීමට ඒ පාරිභෝගිකයා බැඳී සිටිය යුතු ය.

5. (1) තමාගේ ස්ථානයට විදුලි බලය සැපයුවාට පසු යම් විටෙක, තාවකාලිකව හෝ ස්ථිර වශයෙන්, එවකට පාවිච්චි වන ඒවාට වඩා විශාල යම් ලාම්පුවක්, පංකාවක් හෝ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ යම් අමතර ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙන යම් උපකරණයක් සවි කිරීමට හෝ තමාගේ ස්ථානයෙහි ඇද තිබෙන විදුලි කම්බි මොනම ආකාරයකින්වත් වෙනස් කිරීමට හෝ දික්කිරීමට අදහස් කරන සෑම පාරිභෝගිකයකු විසින් ම, එබඳු දික් කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් කලින් විදුලි කම්බි ඇදීමේ කොන්ත්‍රාත්කරුගේ නම සහ ලිපිනයද පිළිබඳ විස්තර සහිත ලියවිල්ලකින් ඒ බව බලපත්‍රලාභියා වෙත දැනුම් දිය යුතු ය.

(2) ප්‍රධාන විදුලිබල සංස්ථාපනයට තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් එවකට පාවිච්චි වන ඒවාට වඩා විශාල යම් දික්කිරීමක්, ලාම්පුවක්, පංකාවක්, මෝටරයක් සම්බන්ධ කිරීම හෝ සම්බන්ධකරවීම නැතහොත් යම් අමතර ලාම්පුවක් හෝ විදුලිය බලය පාවිච්චි වන වෙන යම් උපකරණයක් සවි කිරීම, ඒ දික්කිරීම, ලාම්පුව, පංකාව, මෝටරය, අමතර ලාම්පුව හෝ වෙනත් උපකරණය ඒ වෙනුවෙන් බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු පරීක්ෂා කර සහ අත්හදා බලා සතුටුදායක යයි ඒත්තු ගතහොත් මිස, කිසිම පාරිභෝගිකයකු විසින් නො කළ යුතු ය.

6. (1) යම්කිසි ස්ථානයක බලපත්‍රලාභියාගේ ප්‍රධාන පුලුසුව උණුවී යමින් පවතින්නේ නම්, පාරිභෝගිකයා විසින් ඒ බව වහාම අවස්ථාවෝචිත පරිදි බලපත්‍රලාභියාගේ විදුලිය බලස්ථානය හෝ උප බලස්ථානය හෝ භාර නිලධාරියා වෙත දැනුම් දිය යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් බලය දෙන ලද නිලධාරියකු හෝ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා ඇති කම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින් බලපත්‍රලාභියාගේ දේපළවන උණුවී ගිය පුළුසුවක් වෙනුවට වෙන පුලුසුවක් යෙදීම නො කළ යුතු ය.

(3) පාරිභෝගිකයා හෝ බලපත්‍රලාභියා සතු දේපළ වන යම් පුලුසුවක් ඉවත් කොට වෙනෙකක් දැමීමට බලපත්‍රලාභියාගේ යම් නිලධාරියකුගේ හෝ කම්කරුවකුගේ සේවය වුවමනා කරන්නේ නම්, බලපත්‍රයේ සඳහන් පරිදි ඒ සඳහා ගෙවිය යුතු නියම ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

7. විදුලි බලය සැපයීමේදී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සිදුවන බාධා හේතුකොට ගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන යම් පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා පාරිභෝගිකයාට වගකීමට බැඳී නොසිටී.

8. පහතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුණු විදුලිබල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කරන කල්හි එය අත්හදා බැලීම සහ නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් පරිදි නියමිත ගාස්තුව පාරිභෝගිකයාගෙන් කලින් අය කළ යුතුවාත් හැර, එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතු ය.

9. (1) සියලුම ගාස්තු යම් ගණනක් ඉදිරිපත් කරන දිනයට අයවිය යුතුව තිබෙන සේ සැලකිය යුතු ය.

(2) ගණන ඉදිරිපත් කොට සතියක් ඇතුළත දී කරන ලද්දේ නම් මිස, ගණනක හරිවැරදි පිළිබඳ කිසිම පැමිණිල්ලක් බලපත්‍රලාභියා විසින් භාර නො ගත යුතු ය.

10. (1) සවකීය පදිංචි ස්ථානය සඳහා විදුලි බලය අවශ්‍ය නොවන සෑම පරිභෝගිකයකු විසින් ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(2) (1) වෙනි ඡේදයේ සඳහන් පරිදි එසේ දැනුම් දීමක් කර නොමැති කල්හි, විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රලාභියා වෙත දන්වීම ලැබුණු දින සිට දවස් තුනක් ගතවනතුරු තමා පදිංචි ස්ථානයේ වූ බලපත්‍රලාභියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වග කිවයුතු අතර, ඒ ස්ථානයෙහි පාවිච්චි කරන්ට යෙදුන සියලුම විදුලි බලය සම්බන්ධයෙන් පාරිභෝගිකයා ගාස්තු ගෙවීමට ද යටත් විය යුතුය. එසේ වුවද එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රලාභියා විසින් සේවය අසම්බන්ධ කරනු ලැබූ අවස්ථාවක එසේ අසම්බන්ධ කළ වේලාව දක්වා පමණක් ඒ ස්ථානයෙහි පාවිච්චි කරන ලද විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා බැඳී සිටිය යුතු ය.

11. කිසිම පාරිභෝගිකයකු විසින්—

(1) රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරු විසින් විදුලිය කටයුතු කරගෙන යාමට අවශ්‍ය ප්‍රාගුණ්‍යය ඇතැයි සහතික කරන ලද්දා වූ හෝ පිළිගත් විදුලිය වැඩ පොළක දී හෝ වෙළෙඳ සමාගමක දී හෝ විදුලිය බලස්ථානයක දී යටත් පිරිසෙයින් අවුරුදු තුනකවත් ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇත්තාවූ, සහ

(2) අවුරුදු දෙකකට නො අඩු කාල පරිච්ඡේදයක් තුළ නොකඩවා විදුලිය කටයුතු පිළිබඳ ඉංජිනේරු කර්මාන්තයෙහි ව්‍යවෘතව සිටියා වූ, කෙනෙකු නොවන කිසිම තැනැත්තකු—

(අ) බලපත්‍රලාභියාගේ විදුලි සම්පාදක සංදාමයට සම්බන්ධ කිරීමේ අදහසින් පාරිභෝගිකයාගේ යම් ස්ථානයක අලුත් විදුලිබල සංස්ථාපනයක කම්බි ඇදීම හෝ සවිකරන උපකරණ හෝ සවිකරන ලද උපකරණවලට අදාළ යම් වැඩක් කරගෙන යෑම සඳහා, හෝ

(ආ) පාරිභෝගිකයාගේ යම් කිසි ස්ථානයක විදුලිබල සංස්ථාපනයක් බලපත්‍රලාභියාගේ විදුලි සම්පාදක සංදාමයට සම්බන්ධ කළාට පසු ඒ විදුලිබල සංස්ථාපනය සම්බන්ධයෙන්—

(I) විදුලිබල සංස්ථාපනය වෙනස් කිරීම, සකස් කිරීම, දූව යමක් එකතු කිරීම හෝ එය අලුත්වැඩියා කිරීම යුක්තවූ නැතහොත් ඒ ස්වභාවයෙන් යුක්ත වූ, හෝ

(II) විදුලිබල සංස්ථාපනයේ ප්‍රමාණය හා ස්වභාවය කිසිම විධියකින් වෙනස් නොවෙන්නාවූ හෝ ඒ කෙරෙහි බලපෑමක් ඇති නොකරන්නාවූ අන්දමින් සාමාන්‍ය ලෙස ලාම්පු, පංකා, ස්විච් ඇණ හෝ වෙනත් සම්බන්ධ කොටස් වෙනුවට වෙන කොටස් දැමීමක් නොවන්නාවූ යම් විදුලිය වැඩක් සඳහා නො යෙදවිය යුතු ය.

12. (1) යෝජිත කර්මාන්තය බලපත්‍රලාභියාගේ නිලධාරියකු විසින් පරීක්ෂා කර බැලීමට හැකි වන පරිද්දෙන් ඒ පිළිබඳව දවස් දෙකකට නො අඩු දින ගණනකට කලින් බලපත්‍රලාභියා වෙත දැනුම් දීමෙන් පසුව මිස, එවකට පවතින විදුලිබල සංස්ථාපනයක එක් කිරීම්, වෙනස් කිරීම් හෝ සකස් කිරීම් ඇතුළුව සංස්ථාපන කර්මාන්ත බඳු කිසිම විදුලිය කර්මාන්තයක් ආරම්භ නො කළ යුතු ය.

(2) ඒ නිලධාරියා යෝජිත කර්මාන්තය අනුමත කරතොත්, විදුලිය මාපකය සවි කළ යුතු ස්ථානය කොන්ත්‍රාත්කරු සමග සාකච්ඡා කොට ඔහු විසින් නියම කළ යුතු අතර, කොන්ත්‍රාත්කරු විසින් පහතේ 60 වැනි වගන්තිය යටතේ ඒ සඳහා සම්පාදනය කරනු ලැබිය හැකි නියෝග වලට අනුකූලව ඒ කර්මාන්තය කර ගෙන යා යුතු ය.

13. (1) 12 වෙනි නියෝගයෙහි සඳහන් යම් විදුලිය කර්මාන්තයක් අවසාන කළ විට, බලපත්‍රලාභියා විසින් ඒ සඳහා බලය පැවරූ යම් නිලධාරියකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂා කොට අත්හදා බැලිය යුතු අතර—

(අ) විදුලිබල සංස්ථාපනය නියමිත නියෝගවලට එකඟව පවත්නේ නම්, ඒ ස්ථානයට විදුලිය බලය සැපයීම කළ යුතු අතර,

(ආ) විදුලිබල සංස්ථාපනය නියමිත නියෝගවලට එකඟව නො පවත්නේ නම්, විදුලිබල සංස්ථාපනය එකී නියෝගවලට එකඟ වන පරිද්දෙන් සකස් කරන තුරු විදුලි බලය සැපයීම නොකළ යුතු ය.

(2) මේ නියෝගය යටතේ යම් විදුලිබල සංස්ථාපනයක් පරීක්ෂා කර බැලීම හා අත්හදා බැලීම සඳහා ගෙවිය යුතු ගාස්තුව පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

14. බලපත්‍රලාභියා වෙත දැන්වීමක් නොකර හා ඔහුගේ අනුමතිය කලින් ලබා නොගෙන යම් කිසි ස්ථානයක අලුත් විදුලිබල සංස්ථාපනයක් සම්බන්ධයෙන් වූ යම් විදුලිය කර්මාන්තයක් කරගෙන යනු ලබන්නේ නම්, ඒ විදුලිය කර්මාන්තය කරගෙන යනු ලැබූ ස්ථානයට විදුලි බලය සැපයීම බලපත්‍රලාභියා සිනා ප්‍රතික්ෂේප කළ හැකි ය, නැතහොත් බලපත්‍රලාභියා විසින් ඒ සඳහා බලය දෙන ලද නිලධාරියා අවශ්‍ය යැයි අදහස් කරන පරිද්දෙන් විදුලි කම්බි ඇද තිබෙන ආකාරය වෙනස් කිරීමට හෝ අලුතු කිරීමට එම කර්මාන්තය කළ පාරිභෝගිකයාට නියම කළ හැකි ය. එකී වෙනස් කිරීම් හා අලුතු කිරීම් යථා පරිදි කරන ලද නම් සංස්ථාපනය එකී නිලධාරියා විසින් නැවත පරීක්ෂා කොට අත්හදා බලා නිසි පිළිවෙළට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයට විදුලිය බලය සැපයිය යුතු ය.

15. බලපත්‍රලාභියාට කලින් දැන්වීමක් නොකර හා ඔහුගෙන් අවසරයක් නො ලබා බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියකට සවි කර ඇත්තා වූ සංස්ථාපනයකට යම් දීර්ඝ කිරීමක් කරනු ලැබූ විට සම්පූර්ණ සංස්ථාපනය ම බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් අසම්බන්ධ කිරීමට යටත් විය යුතු ය.

16. සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම බලපත්‍රලාභියා විසින් ඒ සඳහා සපයනු ලැබිය හැකි ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතු අතර විදුලි බලය සැපයීම අවශ්‍ය අවස්ථාවට පැය හතළිස් අටකට නො අඩු කාලයකට ප්‍රථම බලපත්‍රලාභියාගේ කාර්යාලය වෙත භාර දිය යුතු ය.

3-495—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර සඳහා මහ නගර සභාවක් සංස්ථාපනය කිරීම

පහත සඳහන් කරුණු ගැන පරීක්ෂා කොට වාර්තා කර සිටීම පිණිස පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අධිනිතිඥ එච්. වනිගතුංග මහතා පත් කරන්ට යෙදුන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) මේ අවස්ථාවේදී රත්නපුර සඳහා මහ නගර සභාවක් සංස්ථාපනය කිරීම මහජන යහපත උදෙසා වේද ?

(ආ) එසේ නම්, දැනට පවත්නා රත්නපුර නගර සභාවේ පාලන සීමාවන්ගෙන් පිටත දියුණු ප්‍රදේශ ඇතොත්, ඒවා යෝජිත මහ නගරසභාවට ඇතුළත් කළ යුතුද ?

(ඇ) යෝජිත මහ නගර සභාවේ සීමාවන් විස්තර කිරීම :—

(ඈ) යෝජිත මහ නගර සභා ප්‍රදේශයේ ප්‍රමාණය, ජනගහණය, හා වෙනත් සාධක අනුව සිටිය යුතු සභික සංඛ්‍යාව කොපමණදැයි නිගමණය කිරීම,

(ඉ) යෝජිත නගර සභාවේ එක් එක් කොට්ඨාශයේ සීමාවන් විස්තර කිරීම යන මේවාය.

මෙම පරීක්ෂණය විෂයයන්හි ලා සැලකෙන ඉහත සඳහන් සියලුම කරුණු ගැන හෝ ඒවායින් එකක් ගැන හෝ තම තමන්ට ප්‍රකාශ කිරීමට තිබෙන අදහස් උදහස් මෙම දන්වීම පළවී සති දෙකක් තුළ දී පළමුව ලියවිල්ලකින් මාවෙත ඉදිරිපත් කරණ ලෙස මහ ජනයාගෙන් සහ සමිති සමාගම් හා සංස්ථාවන් ගෙන් ද මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. මෙසේ ප්‍රකාශ කරනු ලබන සියලුම කරුණු පිටපත් තුනකින් යුතුව හැකි නම් ටයිප් මුද්‍රිතවද ඉදිරිපත් කිරීම යෙහෙකි.

මෙම කොමිෂන් සභාව විසින් රත්නපුර නගර ශාලාවේදී ප්‍රසිද්ධ සභා වාරයක් පවත්වනු ලැබේ. එම දිනයන් යථා කාලයේදී දැනුම් දෙමි.

ඇල්. ජී. සිරිවර්ධන, (ප.පා.ස.කො.) ලේකම්,
රත්නපුරය සඳහා මහ නගර සභාවක් සංස්ථාපනය කිරීමේ කොමිෂම.

පළාත් පාලන කාර්යාලය,
රත්නපුර.

3-510—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශිය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න.)

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමර්ථ්‍යයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ඈ) **කාර්යක්ෂමතා කඩයිම්.**—පත්වීම් ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. සේවා මුක්ත හටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් නැත නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට** පුළුවන.

**8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.**

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම්ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් හැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) ,යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වූවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් වහාම මීට සාකොට ඇති ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ.. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

## ———— තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා / ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) **සේවා මුක්ත භටයෙක් නම් :—**

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව **ප්‍රවීණතාවක් ඇද්ද :————.**

(අ) **සිංහල :————.**

(ආ) **දෙමළ :————.**

13. විශේෂ සුදුසුකම්—ගැසට් **නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ / හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර. දින වකවානු සහිතව සඳහන් කරන්න :————.**

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, **නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.**

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් **ඔබේ ණය** බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

**මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්,** නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
**අයදුම්කරුගේ අත්සන.**

**දිනය :————.**

**සභාපති,**
**පළාත් පාලන සේවා කොමිෂන් සභාව,**
**තැ. පෙ. 530,**
**කොළඹ 1.**

---

## පළාත් පාලන සේවය

### සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. තෝරාගනු ලබන අයදුම්කරු, පළමුකොටම කොළඹ නාගරික සභාවට පත්කරනු ලබන අතර, කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට ඔහුට නියම කරනු ලැබේ. තවද, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට ඔහුට අවසර නැත.

3. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 8,880—9×480—රු. 13,200 වේ. මෙම වැටුප් ක්‍රමයෙහි රු. 11,280 යන වාර්ෂික වැටුපෙහි දැවුරුදු නැවැත්මක් සහ රු. 11,760 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත. තෝරාගනු ලබන අයදුම්කරු ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පෙත්තක තැබිය හැක.

4. ඉහත වූ 3 වන ඡේදයෙහි සඳහන් වැටුපට අතිරේකව, පහත සඳහන් ආකාරයට විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් ද, පත්කරනු ලබන නිලධාරියාට ගෙවනු ලැබේ :—

සේවයේ පළමුවන අවුරුදු හය සඳහා වර්ෂයකට රු. 1,200. එයින් පසු රු. 11,760 වාර්ෂික වැටුප් පෙත්තට පැමිණෙන තුරු සහ ඒ වැටුප් පෙත්තට පැමිණි දින සිට අවුරුදු හතරක් යනතුරු වර්ෂයකට රු. 1,800. ඊළඟ අවුරුදු හතර සඳහා වර්ෂයකට රු. 2,400, ඊළඟ අවුරුදු හතර සඳහා වර්ෂයකට රු. 3,000, ඉන්පසු වර්ෂයකට රු. 3,600.

5. තෝරාගනු ලබන අයදුම්කරු මාරුකිරීමට යටත් වන්නේ ය.

6. අවශ්‍ය සුදුසුකම්—අයදුම්කරුවන් ඇම්.බී.බී.ඇස්. (ලංකා) උපාධිය හෝ ඊට සමාන හෝ ඊට උසස් වෙනත් වෛද්‍ය සුදුසුකමකින් යුක්ත වූවන් විය යුතු අතර, පහත සඳහන් විභාගවලින් එකකිනුත් සමත්ව සිටිය යුතුය :—

(i) ඇම්.ඩී. (ලන්ඩන්) රාජ්‍ය වෛද්‍ය විද්‍යාව.

(ii) ඩී.පී.එච්. (බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක හෝ ටොරොන්ටෝහි විශ්ව විද්‍යාලයේ හෝ ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයක.)

(iii) ඇම්.පී.එච්. (ලංකාව පිළිගෙන ඇති ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝ කැනඩාවේ විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක).

(iv) ඇම්.ආර්.සී.පී. (ලන්ඩන්) හෝ (එඩින්බරෝ) ජන සෞඛ්‍ය.

7. මේ ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966 මාර්තු මස 29 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 9 වැනි ඡේදය වෙනුවට, පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි :—

"9. ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම, ඒවා ලබාගත් දින, වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව."

9. අයදුම් පත්‍ර හෝ අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස් වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුව පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගේ පමණක් ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 මාර්තු මස
තැ. පෙ. 530,
කොළඹ.

3–479—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### නාගරික ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහකාර ඉංජිනේරු (මූලස්ථාන) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරා ගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවට පත් කරනු ඇත.

2. **වැටුප :** තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය—රු. 4,080—360×12 සහ 480×10—රු. 13,200—රු. 11,280 වාර්ෂික වැටුප උඩ දැවුරුදු නැවැත්මක් සහ රු. 9,360, රු. 11,760 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

**සටහන :**

(1) ඒ. ඇම්. අයි. සී. ඊ. හෝ නාගරික ඉංජිනේරු ඒ. ඇම්. අයි. සුදුසුකම් නැති අයට, ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 8,880 වාර්ෂික වැටුප් පියවර ඉක්මවිය නොහැක.

(2) ඒ. ඇම්. අයි. සී. ඊ. සහතිකය ඇති අය, රු. 5,880 ක වාර්ෂික වැටුපකින් ද, නාගරික ඉංජිනේරු, ඒ. ඇම්. අයි. සහතිකය ඇති අය රු. 5,520 ක වාර්ෂික වැටුපකින් ද ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි වැටුප් ලැබීම ආරම්භ කරයි.

(3) අයදුම්කරුවකුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පෙත්තක තබා වැටුප් ගෙවිය හැකිද වේ.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස : 1966 මාර්තු මස 29 වැනි දිනට අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවනට පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී. ඇස්. සී. (ඉංජිනේරු) උපාධිය හෝ නාගරික ඉංජිනේරු ඒ. ඇම්. අයි. විභාගය හෝ ඒ. ඇම්. අයි. සී. ඊ. විභාගයේ 1 සහ 2 යන අංශයන් ගෙන් සාමාර්ථ්‍යයක් හෝ ඊට වඩා උසස් සුදුසුකමක් තිබිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966 මාර්තු මස 29 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් භාරගනු ලබන්නේ, එම අයදුම් පත් අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගත් නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම් පත් පමණක් ලැබුණු බැව් දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
නැ. පෙ. 530,
කොළඹ, 1966 මාර්තු මස 2 දින දීය.

3–480—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

1965 දෙසැම්බර් මාසය තුළදී පහත සඳහන් පත් වීම් කරන්නට ලැබීම ගැන පළාත් පාලන සේවා කොමිෂන් සභාව සතුටු වෙයි :—

### නාගරික සභා

ජේ. වී. සුබ්‍රමණියම් දෙස්තර මහතා, නියෝජ්‍ය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, කොළඹ නාගරික සභාව. ඇම්. ඩබ්ලිව්. සුමතිපාල, අතිරේක ප්‍රධාන තක්සේරු පරීක්ෂක, කොළඹ නාගරික සභාව. ඇස්. අයි. නානායක්කාර, පුස්තකාල සහායක, කොළඹ නාගරික සභාව. ජී. ඇන්. රත්න, පුස්තකාල සහායක, කොළඹ නාගරික සභාව, * කේ. බී. ලයස් සිංඤෝ, සාමාන්‍ය පෙළ ලිපිකරු, කොළඹ නාගරික සභාව. * කේ. ආර්. ඇල්. විජයවර්ධන, සාමාන්‍ය පෙළ ලිපිකරු, කොළඹ නාගරික සභාව. ඇන්. සීබට් සිංඤෝ, පෙදරේරු, පුහුණු 2 වැනි ශ්‍රේණිය, කොළඹ නාගරික සභාව. ආර්. ඇම්. බණ්ඩා, පාර තලන රෝල රියදුරු, කොළඹ නාගරික සභාව. ඇම්. එස්. ඒ. අබේකෝන්, පොත් බඳින්නා, කොළඹ නාගරික සභාව, එච්. සෙල්වරාජා නාගරික කොමසාරිස්, යාපනය නාගරික සභාව. ඒ. පී. ඩයස්, 2 වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි, බදුල්ල නාගරික සභාව. *කේ. ජී. විමලදාස, සාමාන්‍ය පෙළ ලිපිකරු, මහනුවර නාගරික සභාව.

පහත සඳහන් පත් වීම 1965 ඔක්තෝබර් මාසය තුළදී කරන ලදී :—

ඒ. ජී. ප්‍රනාන්දු, ගිණිහට, කොළඹ නාගරික සභාව.

පහත සඳහන් පත් වීම 1965 මාර්තු මාසය තුළදී කරන ලදී :—

ඇම්. ඩී. මර්තේලිස්, ලොරි රියැදුරු, කොළඹ නාගරික සභාව.

### පළාත් ආණ්ඩු සභා

ඇස්. කුලසිංහම්, 2 වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි, රත්නපුර පළාත් ආණ්ඩු සභාව. ආර්. රාජනාදන්, 3 වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි, අවිස්සාවේල්ල ප. ආ., * ඇස්. පෙරමනායගම්, සාමාන්‍ය පෙළ ලිපිකරු, කොලොන්නාව ප. ආ. ස., බී. ඒ. අමරපාල, 2 වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති, ගම්පහ ප. ආ. ස., ඒ. ඇම්. බසීර්, 2 වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති, මඩකලපුව ප. ආ. ස., සී. ඇම්. විජේවර්ධන, 2 වැනි ශ්‍රේණියේ ආදායම් ඕවර්සියර්, බණ්ඩාරවෙල ප. ආ. ස., කේ. ඒ. සයිමන් සිංඤෝ, 1 වැනි ශ්‍රේණියේ කම්බිකරු, මොරටුව ප. ආ. ස.

පහත සඳහන් පත් වීම 1965 ජූලි මාසය තුළදී කරන ලදී :—

යූ. ඕ. පෙරේරා, 2 වැනි ශ්‍රේණියේ තානායම් භාරකරු, වවුනියා ප. ආ. ස.

### සුළු නගර සභා

* කේ. කොඩිකාර, සාමාන්‍ය පෙළ ලිපිකරු, මහරගම සුළු නගර සභාව, ඇස්. ඇස්. සුබ්‍රමණියම්, 2 වැනි ශ්‍රේණියේ ආදායම් හා සෞඛ්‍ය ඕවර්සියර්, චුන්නාකම් සු. න. ස., ඇම්. ඇස්. සිල්වා, 2 වැනි ශ්‍රේණියේ ආදායම් ඕවර්සියර්, කැළණිය සු. න. ස., ජී. බී. සිල්වා, මුරකරු, මිණුවන්ගොඩ සු. න. ස.

### ගම්සභා

ජී. ප්‍රිකාවල, 2 වැනි ශ්‍රේණියේ විදුලිය අධිකාරි, කෝට්ටේ—ගල්කිස්ස ගම්සභාව. * ඩී. ඩබ්. පියරත්න, සාමාන්‍ය පෙළ ලිපිකරු, කුලුගම්මනසියපත්තු ග. ස. * කේ. ජේ. කේ. ඩී. පී. සමරතුංග, සාමාන්‍ය පෙළ ලිපිකරු, යගම්පත්තු ග. ස., * ඒ. ජී. කරුණාදාස, සාමාන්‍ය පෙළ ලිපිකරු, අගලවත්ත ග. ස., ඇස්. ඒ. සෝමසේකරම්, 2 වැනි ශ්‍රේණියේ ආදායම් හා සෞඛ්‍ය ඕවර්සියර්, කරවකු උතුර ග. ස., සී. අන්තරාජා, කාර්යාල කාර්ය සහායක, උඩුවිල් ග. ස., ජී. ඒ. අප්පුහාමි, කාර්යාල කාර්ය සහායක, උඩපත්තු (න. කෝ.) ග. ස. ඩී. පී. ගුණරත්න, කාර්යාල කාර්ය සහායක, පල්ලෙවෙල ග. ස. ඒ. පී. ඇස්. ඩී. ප්‍රනාන්දු, පණිවුඩකරු, අඹගමුව දකුණ ග. ස.

* මෙම පත් වීම් කරන ලද්දේ විභාග ප්‍රතිඵල අනුවය.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

නැ. පෙ. 530,
කොළඹ, 1966 පෙබරවාරි මස 28 දින.

3–518—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### IV වැනි ශ්‍රේණියේ ලේකම්වරුන්ගේ සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1965.2.20

ඉහත සඳහන් විභාගයෙන් සියලුම අපේක්ෂකයින් අසමත් වී ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 මාර්තු මස 2 දින
නැ. පෙ. 530,
කොළඹ.

3–478—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී—බී 28/58

## චන්කානෙයි සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 වැනි වගන්ති යටතේ චාන්කානෙයි සුළු නගර සභාව විසින් පනවනු ලැබ එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

කොළඹ දීය.

### වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාළ අතුරු ව්‍යවස්ථාව

1946 ඔක්තෝබර් 4 වැනි දින අංක 9,609 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවල 211 වැනි ව්‍යවස්ථාව යටතේ සැපයීමට නියමිත උපලේඛනය එකී ව්‍යවස්ථා චන්කානෙයි සුළු නගර සභාවට අදාළ ප්‍රමාණයට නොසැපයිය යුතු ය.

3–481—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී 89/49

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ කඳුකර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති වරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 පෙබරවාරි මස 24 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1957 අප්‍රේල් 26 වන දින අංක 11,112 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවල 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයෙහි අගට පහත සඳහන් අලුත් විෂය, එනම්:—

"(ග) දුම්කොළ වියලීම හෝ සකස් කිරීම" යන්න එකතු කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3–519—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

ඇ.ඩී.—බී 43/47

## හපුතලේ නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ, හපුතලේ නගර සභාව විසින් පනවනු ලැබ, එම ආඥා පනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථාව

හපුතලේ නගර සභාව විසින් පනවනුලැබ 1948 මැයි මස 14 වැනි දින අංක 9,863 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ කලින් කල සංශෝධිත ප්‍රසිද්ධ වෙළඳපොළ සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා ඊට යාකොට ඇති බී උපලේඛනය වෙනුවට පහත සඳහන් නව උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

### බී උපලේඛනය

#### ගාස්තු ප්‍රමාණය

| | අවසර පත්‍රය | කුලිය හෝ ගාස්තුව රු. ශ. |
|---|---|---|
| 1. | ස්ථිර කඩ කාමරයක් සඳහා ... ... | මසකට 10 0 |
| 2. | වෙළඳපොළේ පහත බිම් මාලයේ හපුතලේ–බදුල්ල පාරට මුහුණලා ඇති ස්ථිර කඩ කාමරයක් සඳහා... | මසකට 30 0 |
| 3. | දිනක හෝ ඉන් අඩ ප්‍රමාණයක් වෙනුවෙන් ස්ථිර කඩ කාමරයකට ... ... | 1 0 |
| 4. | දෙසතියක හෝ ඉන් අඩ කාලයකට තාවකාලික කඩ කාමරයක් සඳහා ... ... | 2 50 |
| 5. | වෙළඳපොළේ එළිමහන් බිමේ (වර්ග අඩි 3 ක් හෝ ඉන් කොටසක්) සඳහා ... ... | දිනකට 15 |

3–508—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 7/65
ජීසී 55/1/15

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටගිර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966. 2. 24 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටගිර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පිළිගන්නා ලද, වෙළඳ පොළවල් හා පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන්, සඳහා පහළ මාවතගම වෙළඳපොළ සම්බන්ධයෙන් වූ "වෙළඳපොළ ප්‍රදේශය" එකී වෙළඳ පොළේ සිට සැතැප්මක අර්ධ විෂ්කම්භයක කවයක් ඇතුළතවූ ප්‍රදේශය විය යුතුය.

2. පහළ මාවතගම පොළේ යම් කිසි බිම් ප්‍රමාණයක් හෝ වෙළඳ පිළක් පාවිච්චි කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් පනවා අය කළ යුතුය:—

| | | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|---|
| (1) | එක් එක් වෙළඳ පිළ සඳහා ... ... | 0 50 |
| (2) | හතරැස් අඩි 4කට නොවැඩි එක් එක් බිම් ප්‍රමාණය සඳහා ... ... | 0 10 |
| (3) | හතරැස් අඩි 4කට වැඩි එහෙත් හතරැස් අඩි 10 කට නොවැඩි එක් එක් බිම් ප්‍රමාණය සඳහා ... | 0 20 |
| (4) | බිම් ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය හතරැස් අඩි 10කට වැඩිවන කල්හි එක් එක් හතරැස් අඩියකට හෝ එහි කොටසකට ... ... | 0 03 |

3–501—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

ඇල්. ඞී.—බී 147/47
ප.පා.දෙ—ජීඊ 19/2/13/1

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ හොරවල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966, 2 මස 24 වැනි දින,
කොළඹදී ය.

#### අතුරු ව්‍යවස්ථාව

කළුතර දිස්ත්‍රික්කයේ හොරවල-දොඩන්ගොඩ-මතුගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලදුව 1962 වර්ෂයේ දෙසැම්බර් මස 7 වන දින අංක: 13,423 දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද, රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව- එය හොරවල ගම් ප්‍රදේශයේ ගම් සභාවට අදාළ වනතාක් දුරට එහි උපලේඛනය වෙනුවට මෙයට යාකොට ඇති උපලේඛනය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

#### උපලේඛනය

1. කරත්තයක්, තිරික්කලයක්, රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අත් දමක වාහනයක් සඳහා : ... හො. ග. ස. වා.
2. ගොන්දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... හො. ග. බ. ක.
3. තනිගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... හො. ග. ස. බ. බා.
4. අත් කරත්තයක් සඳහා ... හො. ග. ස. අ. ක.
5. ජින් රික්ෂෝ රථයකට ... හො. ග. ස. ජි.
6. බයිසිකලයකට ... හො. ග. ස. බ.

3-504—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම්

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

#### ගාලු දිස්ත්‍රික්කය

#### පිලාන-මැටරඹ ගම් සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වැනි අධිකාරය) 66 (2) වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ පිලාන-මැටරඹ ගම්සභාවේ අංක 1 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා දෙල්ගහවත්තගේ සුමතිපාල නානායක්කාර මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 මාර්තු 4 වැනි දින,
කොළඹ දී ය.

3-477—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

#### යාපනය දිස්ත්‍රික්කය

#### චාවකච්චේරි නගර සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ, චාවකච්චේරි නගර සභාවේ අංක 8 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා මයිල්වාගනම් වේලායුදම් මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 මාර්තු 4 වැනි දින,
කොළඹ දී ය.

3-476—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

### පොල්ගහවෙල සුළු නගර සභාව

#### ආදායම් හා වියදම් ලේඛනය—1964

**ආදායම**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 96,735 57 | |
| බී.—මහා මාර්ග ... ... | 1,981 90 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 4,666 40 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 29,134 24 | |
| ඊ.—මහජන ක්‍රීඩා ... ... | 9,849 40 | |
| ඇෆ්.—සොහොන් බිම් ... ... | 33 0 | |
| ජී.—සුනඛයන් ලියාපදිංචි කරවීම ... | 56 0 | |
| එච්.—කිරුම් හා මිනුම් ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාව ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 438 76 | |
| | | 1,42,895 27 |

**වියදම**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 40,984 32 | |
| බී.—මහා මාර්ග ... ... | 17,766 47 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 12,642 51 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 78,905 72 | |
| ඊ.—මහජන ක්‍රීඩා ... ... | 279 50 | |
| ඇෆ්.—සොහොන් බිම් ... ... | 15 0 | |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කරවීම ... | 358 10 | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාව ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 3,143 96 | |
| | | 1,54,095 58 |

**වෙනත් ලැබීම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| 1. | තැන්පත් ... ... | 21,428 05 | |
| 2. | අත්තිකාරම් ... ... | 8,706 40 | |
| 3. | අධිකය හා ඌණතාවය ගිණුම (සාමාන්‍ය) ... ... | 219 82 | |
| 4. | අධිකය හා ඌණතාවය ගිණුම (විදුලිය) ... ... | 42 94 | |
| 5. | අගය අඩුවීම සඳහා වෙන්කිරීම (විදුලිය) ... ... | 1,000 0 | |
| 6. | විදුලිය ගිණුම් ... ... | 1,00,369 80 | |
| 7. | ස්ථිර තැන්පත් ... ... | 30,000 0 | |
| 8. | ලංකා සේවිංස් බැංකුවේ තැන්පත් ගිණුම් ... ... | 570 17 | |
| 9. | විවිධ ණයකරුවෝ ... | 14,879 41 | |
| 10. | විවිධ ණයහිමියෝ ... | 18,028 39 | |
| 11. | ආදායම් එකතුවේ ගණුදෙනු : | | |
| | (ඒ) දේපල බදු ... | 20,391 55 | |
| | (බී) වසුරු බදු ... ... | 12,740 59 | |
| | (සී) වසුරු ගාස්තු ... | 425 0 | |
| | (ඩී) විදුලි ගාස්තු ... | 78,840 12 | |
| | (ඊ) වරෙන්තු ගාස්තු ... | 630 57 | |
| | (ඇප්) කුලී ... ... | 18,585 41 | |
| | | | 3,26,858 22 |
| | | | 4,69,753 49 |
| | 63.12.31 ඉතිරි ... | | 43,602 30 |
| | | | 5,13,355 79 |

**වෙනත් ගෙවීම්**

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| 1. | තැන්පත් ... ... | 22,285 20 | |
| 2. | අත්තිකාරම් ... ... | 8,590 05 | |
| 3. | අධිකය හා ඌණතාවය ගිණුම (සාමාන්‍ය) ... ... | 25 13 | |
| 4. | අධිකය හා ඌණතාවය ගිණුම (විදුලිය) ... ... | 21 47 | |
| 5. | ණය ගිණුම් ... ... | 12,909 10 | |
| 6. | විදුලිය ගිණුම් ... ... | 1,00,042 54 | |
| 7. | ලංකා සේවිංස් බැංකුවේ තැන්පත් ගිණුම් ... ... | 61 42 | |
| 8. | විවිධ ණයකරුවෝ ... | 19,793 87 | |
| 9. | විවිධ ණයහිමියෝ ... ... | 25,957 81 | |
| 10. | ආදායම් එකතුවේ ගණුදෙනු : | | |
| | (ඒ) දේපල බදු ... ... | 19,010 36 | |
| | (බී) වසුරු බදු ... ... | 11,847 65 | |
| | (සී) වසුරු ගාස්තු ... | 465 0 | |
| | (ඩී) විදුලි ගාස්තු ... | 79,795 11 | |
| | (ඊ) වරෙන්තු ගාස්තු ... | 457 79 | |
| | (ඇප්) කුලී ... ... | 19,570 34 | |
| | | | 3,20,832 84 |
| | | | 4,74,928 42 |
| | 64.12.31 ඉතිරි ... | | 38,427 37 |
| | | | 5,13,355 79 |

පොල්ගහවෙල සුළු නගර සභාවේ සභාපති තැන්පත් රණසිංහ ආරච්චිගේ සිරිසේන රණසිංහ වන මම, ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 පොල්ගහවෙල සුළු නගර සභාවේ, ලැබීම් හා ගෙවීම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බව සහතික කරමි.

ර. ආ. සි. රණසිංහ,
සභාපති.

නිවැරැදි බවට සහතික කරන ලදී.

ආර්. පී. ධර්මසේන,
සාමාජික.

1965 ක්වූ ජූනි මස අට වෙනි දින මා ඉදිරිපිට කුරුණෑගලදී සහතික කරන ලදී.

ඩී. ඒ. ඇස්. රණවීර,
සමාදාන විනිශ්චයකාර.

## පොල්ගහවෙල සුළු නගර සභාව

### 1964 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් ලේඛනයයි

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| **තැන්පත්** | | |
| සාමාන්‍ය ... ... | 29,901 59 | |
| ආධාර පාරවල් ... ... | 58 15 | |
| පුස්තකාල ආධාර ... ... | 2,058 17 | |
| නිවාස යෝජනා ක්‍රමය ... | 25,326 94 | |
| | | 57,344 85 |
| **ණය** | | |
| නගර සභා කාර්යාලය ... | 2,789 73 | |
| | | 2,789 73 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් ... ... ... | | 1,472 0 |
| විදුලිය—1963.12.31 වැනි දිනට ඌණතාවය | 17,563 91 | |
| වෙනස්වීම්—එකතුව ... ... | 21 47 | |
| | 17,585 38 | |
| වෙනස්වීම්—අඩුව ... ... | 42 94 | |
| | 17,542 44 | |

| බැරකම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| සාමාන්‍ය | | | |
| 1963.12.31 වැනි දිනට අධිකය ... | | 56,882 54 | |
| වෙනස්වීම් අඩුව ... ... | | 9 87 | |
| | | 56,872 67 | |
| වෙනස්වීම්—එකතුව ... | | 219 82 | |
| | | 57,092 49 | |
| වෙනස්වීම්—අඩුව ... ... | | 15 26 | |
| | | 57,077 23 | |
| 1964.12.31 වැනි දිනට වියදම | 1,54,095 58 | | |
| 1964.12.31 වැනි දිනට ආදායම | 1,42,895 27 | | |
| | | 11,200 31 | |
| 1964.12.31 වැනි දිනට අධිකය ... ... | | | 45,876 92 |
| අගය අඩුවීම සඳහා ආරක්ෂක මුදල (විදුලිය) ... | | | 14,500 0 |
| විවිධ ණය හිමියෝ ... ... ... | | | 18,028 39 |
| | | | 1,38,539 89 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| 1964.12.31 වැනි දිනට ආදායම | 1,00,369 80 | | |
| 1964.12.31 වැනි දිනට වියදම | 1,00,042 54 | 327 26 | |
| 1964.12.31 වැනි දිනට ඌණතාවය | | | 17,215 18 |
| ආදායම් එකතුවීමේ ගණුදෙනු | | | |
| දේපල බද්ද ... ... | | 8,860 53 | |
| වසුරු බද්ද ... ... | | 5,563 18 | |
| විදුලි ගාස්තු ... ... | | 13,824 97 | |
| කුලී ... ... | | 1,540 01 | |
| වැසිකිළි ගාස්තු ... ... | | 130 0 | |
| වරෙන්තු ගාස්තු ... ... | | 29 47 | |
| | | | 29,948 16 |
| ස්ථිර තැන්පත් ... ... ... | | | 30,000 0 |
| සිලෝන් සේවිංස් බැංකුවේ තැන්පත් ... ... | | | 1,682 31 |
| විවිධ ණයකරුවෝ ... ... ... | | | 19,793 87 |
| අත ඉතිරි ... | 3,055 61 | | |
| බැංකුවේ ඉතිරි ... | 35,371 76 | | |
| | | | 38,427 37 |
| | | | 1,38,539 89 |

පොල්ගහවෙල සුළු නගර සභාවේ සභාපති තැන්පත් රණසිංහ ආරච්චිගේ සිරිසේන රණසිංහ වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1964 දෙසැම්බර් මස 31 වැනිදා වනවිට, පොල්ගහවෙල සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරැදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

ර. ආ. සි. රණසිංහ,
සභාපති.

නිවැරදි බවට සහතික කරන ලදී.

ආර්. පී. ධර්මසේන,
සාමාජික.

1965 ක්වූ ජූනි මස අටවෙනි දින මා ඉදිරිපිට කුරුණෑගලදී සහතික කරන ලදී.

ඩී. ඒ. ඇස්. රණවීර,
සමාදාන විනිශ්චයකාර.

3–515—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### කොට්කාවත්ත සුළු නගර සභාව

**1965 වර්ෂයේ 3 වැනි අතිරේක අය වැය ලේඛනය**

**2 වැනි කොටස—විදුලි අංශය**

**වැය ශීර්ෂය**

| | රු. ශ. |
|---|---|
| 1. (ඩී) විදුලි බලය මිළදී ගැනීම ... ... ... ... ... | 11,500 0 |
| | 11,500 0 |

1965 නොවැම්බර් 30 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ යෝජනා අංක 7 අනුව පිළිගන්ට යෙදුනා ඇත.

ඇම්. ඇල්. පෙරේරා,
සභාපති,
කොට්කාවත්ත සුළු නගර සභාව.

1966 පෙබරවාරි 16 දින,
කොට්කාවත්ත සුළු නගර සභා කාර්යාලය,
අංගොඩ.

අනුමත කරන ලදී.

ඩී. ලියනමාන,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
බටහිර පෙදෙස.

1966 පෙබරවාරි 16 දින,
කොළඹ 4.

3–475—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## අකුරැස්ස සුළු නගර සභාව

### 1966 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ඉකුත් වර්ෂයට බලපැවැත්වූ පහත සඳහන් වරිපනම් බදු 1966 වර්ෂයටද එසේම පැනවීමට අකුරැස්ස සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරණු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටි කුඹුරු හැර, අන් සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හතර (4) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් ජූනි මස 30 වැනිදැයින් හා දෙසැම්බර් මස 31 වැනිදැයින් අවසන් වන අයුරු, අර්ධ වාර්ෂිකව ගෙවිය හැකිවේ.

ඞී. ඒ. සූරියආරච්චි,
සභාපති,
සුළු නගර සභාව, අකුරැස්ස.

සුළු නගර සභා කාර්යාලයය,
අකුරැස්ස. 1966 පෙබරවාරි මස 26 වැනි දින.

ε–490/1—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද-1966

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥා පනතේ 161 වැනි වගන්තිය යටතේ, ඉකුත් වර්ෂයට බලපැවැත්වූ පහත සඳහන් උප ලේඛනයෙහි නම් කරන ලද රථ වාහන වලට හා සතුන්ට ඒ ලේඛනයෙහි සඳහන් වාහන හා සත්ත්ව බදු 1966 වර්ෂයටද එසේම පැනවීමට අකුරැස්ස සුළු නගර සභාව තීරණය කර ඇති බවත්,

2. යථෝක්ත ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

ඞී. ඒ. සූරියආරච්චි,
සභාපති,
සුළු නගර සභාව, අකුරැස්ස.

1966 පෙබරවාරි මස 26 දින,
අකුරැස්ස සුළු නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රිකෂෝ රථ, පාපැදි, රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... ... | 5 00 |
| සෑම බරකරත්තයක් සඳහා ... ... | 4 00 |
| සෑම බරභාගයක් හෝ අත් කරත්තයක් සඳහා .... | 2 50 |
| සෑම පාපැදියක් සඳහා ... ... | 1 00 |
| සෑම අලියෙකු සඳහා ... ... | 10 00 |
| සෑම අශ්වයෙකු සඳහා ... ... | 5 00 |
| සෑම බූරුවකු හෝ කොටළුවකු සඳහා ... ... | 2 50 |

3–490/2—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 සහ 163 වන වගන්ති යටතේ අකුරැස්ස සුළු නගර සභාව විසින්, මීට යා කොට ඇති උපලේඛනයෙහි විස්තර කර ඇති බලපත්‍ර සම්බන්ධයෙන් ඒ බලපත්‍ර සඳහා මේ දක්වා අය කළ හැකිව තිබූ බලපත්‍ර ගාස්තු වෙනුවට, මේ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඞී. ඒ. සූරියආරච්චි,
සභාපති,
සුළු නගර සභාව, අකුරැස්ස.

1966 පෙබරවාරි මස 26 දින,
අකුරැස්ස සුළු නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| බලපත්‍රයේ සවභාවය | වාර්ෂික ගාස්තුව රු. ශ. |
|---|---|
| **පහත සඳහන් කාර්‍යයන් සඳහා යම් භූමි භාගයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය පවරන බලපත්‍රය** | |
| කොප්පරා නිෂ්පාදනය හෝ ගබඩා කිරීම ... | 15 00 |
| සපත්තු සෑදීම ... ... | 10 00 |
| වරකට රාත්තල් 28 වැඩියෙන් තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු ආහාර හා ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ... ... | 30 00 |
| සිල්ලර වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු ආහාර හා ආහාර ද්‍රව්‍ය ගබඩාකිරීම ... ... | 10 00 |
| ලී මඩුවක් තබා ගැනීම ... ... | 25 00 |
| දර මඩුවක් තබා ගැනීම/කම්මලක් තබා ගැනීම ... | 5 00 |
| පෝර ගබඩා කිරීම/ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම ... | 10 00 |
| අත් යන්ත්‍රයකින් රබර් සෑදීම .... ... | 15 00 |
| කරවල හෝ ජාඩි ගබඩා කිරීම ... ... | 5 00 |
| හිස්ගෝනි, බෝතල් හෝ පරණ යකඩ ගබඩා කිරීම/කොඩු භාණ්ඩ ගබඩා කිරීම ... ... | 10 00 |
| ධාන්‍ය (වී හෝ වෙනත් ධාන්‍ය වර්ග) ගබඩා කිරීම ... | 15 00 |
| යන්ත්‍රානුසාරයෙන් තෙල් නිපදවන ස්ථානයක් තබා ගැනීම ... ... | 25 00 |
| මුද්‍රණාලයක් තබා ගැනීම ... ... | 25 00 |
| බෙලියඩ් ක්‍රීඩා කාමරයක් පවත්වාගෙන යැම ... | 10 00 |
| භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම ... ... | 25 00 |
| සිංහල හෝ ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යැම ... ... | 15 00 |
| ඩීසල් තෙල් හෝ පැට්‍රල් ගබඩාවක් තබා ගැනීම ... | 100 00 |
| මෝටර් රථ රෙපයාර් හෝ සර්විස් ගරාජයක් තබා ගැනීම ... ... | 30 00 |
| විදුලි කාර්මික ස්ථානයක් තබා ගැනීම ... ... | 50 00 |
| ස්වර්ණාභරණ සාදන ස්ථානයක් තබා ගැනීම ... | 10 00 |
| මෝටර් රථ අමතර කොටස් උපකරණ ගබඩා කිරීම ... | 25 00 |
| අළුත් යකඩ බඩු හෝ සිමෙන්ති ගබඩා කිරීම ... | 20 00 |
| ටයර් සහ ටියුබ් වල්කනයිස් කිරීමේ ස්ථානයක් තබා ගැනීම ... ... | 10 00 |
| රබර් හෝ කුරුඳු ගබඩා කිරීම/සුරුට්ටු හෝ දුම්කොළ ගබඩා කිරීම ... ... | 15 00 |
| පින්තූර රාමු කිරීමේ ස්ථානයක් තබා ගැනීම/බෙලෙක් වැඩ පොලක් තබා ගැනීම ... ... | 5 00 |
| ඡායාරූප ශාලාවක් තබා ගැනීම ... ... | 20 00 |
| ගෘහභාණ්ඩ වෙළඳ සැලක් තබා ගැනීම/වඩුමඩුවක් තබා ගැනීම ... ... | 15 00 |
| ගුවන් විදුලි යන්ත්‍ර රෙපයාර් කිරීමේ ස්ථානයක් තබා ගැනීම ... ... | 15 00 |
| බයිසිකල් රෙපයාර් කිරීමේ ස්ථානයක් තබා ගැනීම ... | 10 00 |
| රබර් දුම් ගෙයක් තබා ගැනීම ... ... | 20 00 |
| තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම ... | 250 00 |
| හුණු පිච්චීම හෝ ගබඩා කිරීම ... ... | 15 00 |
| පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් නිපදවීම හෝ ගබඩා කිරීම ... ... | 10 00 |
| උළු ගඩොල් නිපදවීම ... ... | 5 00 |
| වී මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් තබා ගැනීම ... | 30 00 |
| බේකරියක් තබා ගැනීම ... ... | 25 00 |
| භෝජන ශාලාවක් තබා ගැනීම ... ... | 15 00 |
| තේ කඩයක් තබා ගැනීම අකුරැස්ස කඩ වීදියේ ... | 10 00 |
| තේ කඩයක් තබා ගැනීම ඉන් පිට ප්‍රදේශයේ ... | 5 00 |
| කෝපි කඩයක් තබා ගැනීම ... ... | 2 50 |
| ගවමස් කඩයක් තබා ගැනීම ... ... | 50 00 |
| බාබර් සාප්පුවක් තබා ගැනීම/ලොන්ඩරියක් තබා ගැනීම ... ... | 10 00 |
| ලැගුම් හලක් පවත්වාගෙන යැම ... ... | 200 00 |
| මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කිරීම ... ... | 15 00 |
| ලී මෝලක් තබා ගැනීම ... ... | 25 00 |

3–490/3—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිදුම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වන දින අංක. 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක. 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල XXXVIII වන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට පිදුම ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ජේ. එච්. ජී. ජයමහ,
පිදුම ගම්සභාවේ සභාපති තැන.

1966 ජනවාරි 25 දින,
පිදුම ගම්සභා කායසීලයේදීය.

3-488—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගර සභාව

### නගරසභා ආඥාපනත

### 1966 සඳහා දේපළ වරිපනම් බද්ද

(255 වන අධිකාරය වන) නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය යටතේ ගතවී ගිය 1965 වර්ෂයට බලපවත්වන ලද දේපළ බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට මාතර නගර සභාව තීරණය කර ඇත.

එම තීරණය ප්‍රකාර, මෙම නගර සභා සීමාව තුළ පිහිටි කුඹුරු හැර සෙසු සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට විස්ස බැගින් වූ දේපළ වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකිවන පරිදි මාතර නගර සභාව විසින් 1966 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විල්ෆ්‍රඩ් ගුණසේකර,
සභාපති.

1966 පෙබරවාරි 25 දින,
මාතර නගර සභා කාර්යාලයය.

3-512—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥා පණත

මෙහි පහත ඇති උපලේඛණයේ සඳහන් බලපත්‍ර සම්බන්ධයෙන් ඒ උපලේඛණයේ නියමිත බලපත්‍ර ගාස්තු 1965.11.26 වන දින අංක 14,569 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත බලපත්‍ර ගාස්තු වලට අමතුර වශයෙන් මෙය ගැසට් පත්‍රයේ පළවන් දින සිට (256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥා පණතේ 161 වෙනි හා 163 වෙනි වගන්ති යටතේ හිඟුරක්ගොඩ සුළු නගර සභාව විසින් පණවා ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. අබේරත්න,
සභාපති.

1966 පෙබරවාරි මස 23 වෙනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කායසීලයේදීය.

### උපලේඛනය

පහත සඳහන් කරුණු සඳහා යම් භූමි භාගයක් හෝ ස්ථානයක් තබා ගැණීම සඳහා වූ බල පත්‍රයකට :—

| බලපත්‍ර විස්තරය | වාර්ෂික ගාස්තුව රු. ශ. |
|---|---|
| මුද්‍රණාලයක් පවත්වාගනයාම ... ... | 75 0 |
| දර මඩුවක් පවත්වාගනයාම ... ... | 50 0 |
| ලී මඩුවක් හෝ වඩුමඩුවක් පවත්වාගනයාම ... | 50 0 |
| බීඩි සෑදීම ... ... | 50 0 |
| සුරුට්ටු සෑදීම ... ... | 100 0 |
| සවර්ණාභරණ සෑදීම සඳහා ස්ථානයක් පවත්වාගනයාම ... | 50 0 |
| කම්මලක් පවත්වාගනයාම ... ... | 15 0 |
| විකිණීම සඳහා මිණී පෙට්ටි තබා ගැණීම ... | 50 0 |
| අයිස් ක්‍රීම් සෑදීම ... ... | 50 0 |
| ලෑගුම් හලක් තබා ගැණීම ... ... | 25 0 |
| ටයර් හෝ ටියුබ් වල්කනයිසින් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම ... ... | 20 0 |
| ඡායාරූප ශාලාවක් පවත්වාගනයාම ... ... | 50 0 |
| බයිසිකල් අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගනයාම ... ... | 10 0 |
| හිස්ගෝනි ගබඩා කිරීම ... ... | 100 0 |
| මෝටර් වාහන අලුත්වැඩියාව සඳහා වැඩපොළක් පවත්වාගනයාම ... ... | 25 0 |

3-498—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## පුන්ඩලුඔය උප නගර සභාව

### උපනගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) උප නගර සභා ආඥාපනතේ 161 සහ 163 වන වගන්ති-යටතේ පුන්ඩලුඔය උප නගර සභාව විසින්, මීට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර ඇති බලපත්‍රය සම්බන්ධයෙන්, ඒ බල පත්‍රය සඳහා මේ දක්වා අයකළ හැකිව තිබූ බලපත්‍ර ගාස්තුව වෙනුවට, 1966 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඒ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. පී. ඒ. ප්‍රන්සිස් අප්පුහාමි,
සභාපති.

උප නගර සභා කායසීලය,
පුන්ඩලුඔය,
1966 පෙබරවාරි 16 වැනි දින.

### උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තුව රු. ශ. |
|---|---|
| බලපත්‍රය දෙනු ලබන ඉඩමේ හෝ ස්ථානයේ :— | |
| භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම ... | 100 00 |

3-492—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## රත්තොට සුළු නගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරයේ) 17 (1) වගන්තිය යටතේ නියෝගය**

272 අධිකාරිය වන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි නිලධාරියා වූ රත්තොට සුළු නගර සභාවේ සභාපති ඩබ්ලිව්. එච්. ද සිල්වා වන මම, 1966 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් වන දින වලදී රත්තොට සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

1966 ජනවාරි 6, 13, 20 හා 28.

1966 පෙබරවාරි 4, 13, 19 හා 27.

1966 මාර්තු 6, 13, 20, හා 28.

1966 අප්‍රේල් 4, 12, 19 හා 27.

1966 මැයි 3, 4, 5, 11, 18 හා 26.

1966 ජූනි 2, 3, 10, 17 හා 25.

1966 ජූලි 2, 9, 16, 24 හා 31.

1966 අගෝස්තු 8, 15, 23 හා 30.

1966 සැප්තැම්බර් 6, 13, 21 හා 28.

1966 ඔක්තෝබර් 4, 6, 13, 21 හා 28.

1966 නොවැම්බර් 4, 11, 19 හා 26.

1966 දෙසැම්බර් 4, 11, 19 හා 26.

ඩබ්ලිව්. එච්. ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, රත්තොට.

1966. 2. 23 දින,
රත්තොට සුළු නගර සභා කායසීලයේදීය.

3–493—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## මතුගම සුළු නගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත (272 වන අධිකාරය)**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වන අධිකාරය) 17(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලය පරිදි නියමිත අධිකාරීතැන වූද, මතුගම සුළු නගර සභාවේ සභාපති තැන වූද, දයා ටී පස්කුවල් වන මම, 1966 වර්‍ෂයේදී මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන්වන දිනයන්හි මතුගම සුළු නගර සභා ප්‍රදේශයේ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම සම්පූර්ණයෙන් තහනම් කරමි.

දයා ටී. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
මතුගම, 1966 මාර්තු 1.

### උපලේඛනය

1966 ජනවාරි 6—දුරුතු පසලොස්වක් පොහොය
1966 පෙබරවාරි 4—නවම් පසලොස්වක් පොහොය
1966 මාර්තු 6—මැදින් පසලොස්වක් පොහොය
1966 අප්‍රේල් 4—බක් පසලොස්වක් පොහොය
1966 මැයි 4—වෙසක් පසලොස්වක් පොහොය
1966 ජූනි 2—පොසොන් පසලොස්වක් පොහොය
1966 ජූලි 2—ඇසළ පසලොස්වක් පොහොය
1966 ජූලි 31—ඇසල පසලොස්වක් පොහොය
1966 අගෝස්තු 30—නිකිණි පසලොස්වක් පොහොය
1966 සැප්තැම්බර් 26—බණ්ඩාරනායක අනුස්මරණ දිනය
1966 සැප්තැම්බර් 28—බිනර පසලොස්වක පොහොය
1966 ඔක්තෝබර් 4—සමස්ත ලෝක සත්ව දිනය
1966 ඔක්තෝබර් 28—වප් පසලොස්වක් පොහොය
1966 නොවැම්බර් 26—ඉල් පසලොස්වක් පොහොය
1966 දෙසැම්බර් 26—උඳුවප් පසලොස්වක් පොහොය

3–499—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගහ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත (272 වැනි අධිකාරිය)**

1951 අංක 2 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපනතේ 17 ඒ 1 දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, නියමිත අධිකාරිවූද, කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගහ ගම්සභාවේ සභාපතිවූද, ඩී. සී. ජී. රණසිංහ වන මම, 1966 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් වන දිනයන්හි උඩුගහ ගම්සභාව සීමාතුළ මස් පිණිස සතුන් මැරීම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| මාසය | දිනය | හේතුව |
|---|---|---|
| ජනවාරි | 1 | ජාතික වීරවරයින් අනුස්මරණ දිනය |
| ජනවාරි | 6 | පෝය දිනය |
| ජනවාරි | 13 | පෝය දිනය |
| ජනවාරි | 20 | පෝය දිනය |
| ජනවාරි | 28 | පෝය දිනය |
| පෙබරවාරි | 4 | නිදහස් සමරු දිනය සහ පෝය දිනය |
| පෙබරවාරි | 12 | පෝය දිනය |
| පෙබරවාරි | 19 | පෝය දිනය |
| පෙබරවාරි | 27 | පෝය දිනය |
| මාර්තු | 6 | පෝය දිනය |
| මාර්තු | 13 | පෝය දිනය |
| මාර්තු | 20 | පෝය දිනය |
| මාර්තු | 28 | පෝය දිනය |
| අප්‍රියෙල් | 4 | පෝය දිනය |
| අප්‍රියෙල් | 19 | පෝය දිනය |
| අප්‍රියෙල් | 27 | පෝය දිනය |
| මැයි | 3 | වෙසක් පසලොස්වක දිනට පෙර දිනය |
| මැයි | 4 | වෙසක් පෝය දිනය |
| මැයි | 11 | පෝය දිනය |
| මැයි | 18 | පෝය දිනය |
| මැයි | 26 | පෝය දිනය |
| ජූනි | 2 | පෝය දිනය |
| ජූනි | 10 | පෝය දිනය |
| ජූනි | 17 | පෝය දිනය |
| ජූනි | 25 | පෝය දිනය |
| ජූලි | 2 | පෝය දිනය |
| ජූලි | 9 | පෝය දිනය |
| ජූලි | 16 | පෝය දිනය |
| ජූලි | 24 | පෝය දිනය |
| ජූලි | 31 | පෝය දිනය |
| අගෝස්තු | 8 | පෝය දිනය |
| අගෝස්තු | 15 | පෝය දිනය |
| අගෝස්තු | 23 | පෝය දිනය |
| අගෝස්තු | 31 | පෝය දිනය |
| සැප්තැම්බර් | 6 | පෝය දිනය |
| සැප්තැම්බර් | 13 | පෝය දිනය |
| සැප්තැම්බර් | 21 | පෝය දිනය |
| සැප්තැම්බර් | 28 | පෝය දිනය |
| ඔක්තෝබර | 4 | සත්ව දිනය |
| ඔක්තෝබර | 6 | පෝය දිනය |
| ඔක්තෝබර | 13 | පෝය දිනය |
| ඔක්තෝබර | 21 | පෝය දිනය |
| ඔක්තෝබර | 28 | පෝය දිනය |
| නොවැම්බර | 4 | පෝය දිනය |
| නොවැම්බර | 11 | පෝය දිනය |
| නොවැම්බර | 19 | පෝය දිනය |
| නොවැම්බර | 26 | පෝය දිනය |
| දෙසැම්බර | 4 | පෝය දිනය |
| දෙසැම්බර | 11 | පෝය දිනය |
| දෙසැම්බර | 19 | පෝය දිනය |
| දෙසැම්බර | 26 | පෝය දිනය |

ඩී. සී. ජී. රණසිංහ,
උඩුගහ ගම්සභාවේ සභාපති.

1966 පෙබරවාරි 28 දින,

මීරිගම උඩුගහ ගම්සභා කාර්යාලයේදී.

3–507—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තු මැද ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් අය එහි සඳහන්කර තිබෙන ස්ථානයේ 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්වා ඉල්ලුම් පත්‍රයක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධනය කරණලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍රයක් නිකුත් කිරීම ගැන, පොලොන්නරුව මැදපත්තු මැද ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේනම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන හේතුවක් නිසා ද යන වග සඳහන් ලිය විල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| වර්ෂය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|---|
| 1966 ... | ඇස්. ඇම්. සාලි, අංක 106, සේවාගම, පොලොන්නරුව | අංක 8, වලේකඩේ, එළුමස් |

ජේ. ඒ. සිරිසුමන,
පොලොන්නරුව මැදපත්තු මැද ගම්සභාවේ සභාපති තැන.

මැදපත්තු මැද ගම්සභා කායර්‍යාලය,
පො/පළුගස්දමන, 1966.3.1.

3–485—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## අටුළුගම ගම්සභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) අංක 7 (2) (ඒ) සහ (බී) වගන්තිය යටතේ දැනුම් දීමයි

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් නම් ඇති අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1966 වර්ෂයට ගවයන් මරා මස් විකිණීමේ වෙළඳාමක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන අටුළුගම ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව ලියවිල්ලකින්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14ක් ඇතුළත මෙහි මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා පිහිටීම | වෙළඳමේ ස්වභාවය |
|---|---|---|
| ඇම්. ඇම්. ෂරිප්දීන්, 359/1, තල්දූව, අවිස්සාවේල්ල | තාප්පකඩේ වත්ත, නාපාවල | ගවමස් කඩය |

ජේ. ඒ. රිචඩ්,
සභාපති,
අටුළුගම ගම් සභාව.

අටුළුගම ගම්සභාව,
දෙහිඕවිට,
1966 මාර්තු 1 දින.

3–483—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## ආනවිලුන්දන් පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් 1966 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට ආනවිලුන්දන් පත්තු ගම් ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්' මස් මරන්නන් පිළිබඳ ආඥාපන්තේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. ජේ. බී. ලසාල් කුරේ, බත්තුලුඔය | හරක් මස් වෙළඳාම | බත්තුලුඔය " රෝඩ්සයිඩ් " වත්තේ පිහිටි කඩය |
| 2. ඇස්. ඒ. පබිලිස් අප්පුහාමි, ලොට් 80, කටුපොත, මුන්දලම | ඌරු මස් වෙළඳාම | කටුපොත ලොට් 80 දරණ ඉඩමේ ඇති කඩය |

තොං. එ. ජාන්ස,
ආනවිලුන්දන් පත්තු ගම්සභාවේ සභාපති.

ගම්සභා කායර්‍යාලය,
ආරච්චිකට්ටුව, රාජකදළුව,
1966 පෙබරවාරි 25 දින.

3–520—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## දෙහිගම්පල් කෝරළේ එගොඩපොත පත්තු ගම්සභාව

### ගම්සභා ආඥාපනත (257 පරිච්ඡේදය)

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ එගොඩපත පත්තු ගම්සභාව විසින් පහත දක්වෙන යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඕ. වී. විජේමාන්න,
දෙහිගම්පල් කෝරළේ එගොඩපොත පත්තු
ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
ඉඹුලාන, රුවන්වැල්ල,
66.2.25.

### යෝජනාව

" 1965 සැප්තැම්බර් මස 29 වැනි දින දරණ වාර්තාවේ අංක 2 (2) දරණ යෝජනාව අනුව 1966 ජනවාරි 12 වැනි දින අංක 14,634 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පමුණුවන ලද දෙහිගම්පල් කෝරළේ එගොඩපොත පත්තු ගම් ප්‍රදේශයේ ගම්සභා කරත්ත පාරවල් සහ ගම්සභා අඩිපාරවල් පිළිබඳ කිසිම විරෝධයක් ඉදිරිපත් කර නැති හෙයින් එසේ ප්‍රසිද්ධියට පමුණුවා ඇති පාරවල් සියල්ල 1961 අංක 60 දරණ සංශෝධිත ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ ගම්සභාව විසින් පාලනය කරන ලද දේපල හැටියට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ යයි සභාපති තැන්පත් දොන් ඕස්මන් වික්ටර් විජේමාන්න මහතා විසින් ඉදිරිපත් කළ යෝජනාව ඊ. ඒ. විසෝලිස් සිංඤෝ මහතාගේ සවිරත්වයෙන් පසු ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය."

2–509—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## මාවනැල්ල සුළු නගර සභාව

**1966 වර්ෂය සඳහා දේපල බද්ද**

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරිය)

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරිය) යටතේ ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට මාවනැල්ල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (II) වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකමින් සියයට නවය බැගින් වූ වාර්ෂික බදු පිළිවලින් මාර්තු 31 වැනිදායින් ජූනි 30 වෙනිදායින් සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඒ. ඇල්. ඇම්. යූසුප්,
සභපති,
සුළු නගර සභාව, මාවනැල්ල.

1966 ක්වූ ජනවාරි මස 2 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කායර්‍යාලයේදීය.

3–489—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## අලව්ව ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේදී 1966 වර්ෂයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡෙදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තිය සංශෝධනය කරනලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන අලව්ව ගම් ප්‍රදේශයේ ගම් සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන හේතූන් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් තුළදී මා වෙත එවිය යුතු බැව් මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම කරන ස්ථානය | වෙළඳම |
|---|---|---|
| 1. ඒ. ඒ. ලූකස් ඔස්ටින් මහතා, රවුම් පාර, කදාන | අහහරුවාද පොල, අලව්ව | වෙළඳාම් ඌරු මස් |

යූ. බී. අලව්ව,
අලව්ව ගම්සභාවේ සභාපති.

1966 පෙබරවාරි මස 26 වෙනි දින,
අලව්ව ගම්සභා කාර්යාලයේදීය.

3–513—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## හෝමාගම සුළු නගර සභාව

**1966 වර්ෂය සඳහා වරිපනම් පොත්**

1966 වර්ෂය සඳහා කොට්ඨාශ අංක 1-7 වෙනුවෙන් පිළියෙළ කළ වරිපනම් පොත් දැනට සූදානම්ව ඇති බවත්, එම පොත් කායර්‍යාලීය වේලාවන් හිදී පරීක්ෂා කළහැකි බවත්, 256 වෙනි අධිකාරයවූ සුළු නගර සභා ආඥාපනතේ 165 වෙනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වෙනි අධිකාරයවූ නාගරික සභා ආඥාපනතේ අංක 235 (1) දරන වගන්තිය අනුව මෙයින් මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1966 පෙබරවාරි මස 25 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කායර්‍යාලයේදීය.

3–516—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

---

## රත්තොට සුළු නගර සභාව

**1966 වර්ෂයේ වරිපනම් ලේඛන**

1966 වර්ෂය සඳහා මෙම නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කායර්‍යාල වේලාවන් හිදී මෙම කායර්‍යාලයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරයවූ මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. එච්. ද සිල්වා,
රත්තොට සුළු නගර සභාවේ සභාපති.

1966.2.25 දින,
රත්තොට සුළු නගර සභා කායර්‍යාලයේදීය.

3–491—66.3.11 දින අංක 14,686 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සති පතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනය බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 66. 3. 4 | සිකුරාද ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද ... | 66. 3.17 | බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 66. 4. 1 | සිකුරාද ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්දා ... | 66. 3.31 | බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි ... | 66. 5. 6 | සිකුරාද ... | 66. 4.26 | අඟහරුවාදා | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි ... | 66. 6. 3 | සිකුරාද ... | 66. 5.25 | බදාදා | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්දා ... | 66. 6. 1 | බදාදා | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්දා ... | 66. 6. 9 | බ්‍රහස්පතින්දා | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද ... | 66. 6.16 | බ්‍රහස්පතින්දා | දවල් 12 |
| ජූලි ... | 66. 7. 1 | සිකුරාද ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද ... | 66. 7.14 | බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්දා ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්දා ... | 66.10.20 | බ්‍රහස්පතින්දා | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්දා ... | 66.10.27 | බ්‍රහස්පතින්දා | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්දා ... | 66.11. 3 | බ්‍රහස්පතින්දා | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද ... | 66.11.10 | බ්‍රහස්පතින්දා | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද ... | 66.11.24 | බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද ... | 66.12. 8 | බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද ... | 66.12.22 | බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි